ලංකාව

(1)

# වර්ෂ 1952කේ අංක 44 දරණ
# උඩරට විවාහ හා දික්කසාද
# ආඥාපනත

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

කොළඹ ආණ්ඩුවේ පොත් පත් ආයතනයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: [illegible]

තැපැල් ගාස්තුව: ශත 35යි.

# වර්ෂ 1952 ක් අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද ආඥාපනත

උඩරට විවාහ හා දික්කසාද සම්බන්ධවූ නීතිය සංශෝධනය කොට ඒකාබද්ධ කිරීම පිණිසත්, ඒ හා සම්බන්ධවූ නොහොත් ඊට ආගන්තුකවූ කරුණු සඳහා විධිවිධාන සම්පාදනය කිරීම පිණිසත්, පනවන ලද ආඥාපනතකි.

## පටුන

1. ලුහුඬු නාමය හා වලංගු වන දිනය.
2. පනත අදාළ වීම.
3. උඩරට නීතියට යටත්වූ පුද්ගලයන් අතර සිදුවන විවාහ.

## Iවෙනි කාණ්ඩය

### උඩරට විවාහ පිළිබඳ සම්ප්‍රදාය සහ අවජාත දරුවන් සුජාත කරවීම

4. විවාහය සඳහා නීත්‍යනුකූල වයස.
5. විවාහය සඳහා තහනම් වූ ඥාති සම්බන්ධතා.
6. ප්‍රථම විවාහය නීත්‍යනුකූලව අවලංගු කරන තුරු දෙවෙනි විවාහයක් වලංගු නො වන බව.
7. අවජාත දරුවන් සුජාත කරවීම.

## IIවෙනි කාණ්ඩය

### විවාහය සඳහා කැමැත්ත

8. අබුවයස්කාරයකුගේ විවාහය සඳහා කැමැත්ත අවශ්‍ය බව.
9. කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමට ඇති බලය.
10. දිස්ත්‍රික් ලේකම් තැනගේ කැමැත්ත.
11. ඇපැල්.
12. ඇපැල් සම්බන්ධයෙන් උසාවියට ඇති බලය.
13. පක්ෂවලට සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දිය යුතු බව.
14. ඇපැල් ඇසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.
15. උසාවියේ ආඥාවක ප්‍රතිඵලය.

## IIIවෙනි කාණ්ඩය

### උඩරට විවාහ ලියාපදිංචි කිරීම

16. උඩරට විවාහ කර ගැනීමේදී ඒ ගැන දැනුම් දීම.
17. උඩරට විවාහ පිළිබඳ දැන්වීම් ඇතුළත් කිරීම හා ප්‍රසිද්ධ කිරීම.
18. උඩරට විවාහ පිළිබඳව සහතික නිකුත් කිරීම.
19. විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීම සඳහා විශෙෂ බල පත්‍ර.
20. විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීමට විරුද්ධව දැක්විය හැකි විරුද්ධතා.
21. විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීමට විරුද්ධව දක්වන විරුද්ධතා පිළිබඳව විභාග පැවැත් වීම.

1—J. N. R. 37907—1,015 (7/53)

22. උඩරට විවාහ සිදු කිරීම.
23. උඩරට විවාහ ලියාපදිංචි කිරීම.
24. උඩරට විවාහ සිදු කිරීම හා ලියාපදිංචි කිරීම බලය දෙන ලද ස්ථානවලදී බලය දෙන ලද වේලා අතර දී සිදු වූ ඒවා වීමට අවශ්‍ය වූ කරුණු.
25. ලේකම්වරුන් විසින් කරන ලද සටහන්වල දෙවෙනි පිටපත් යැවීම.
26. විවාහ ලියාපදිංචි කිරීමේ සටහනේ මුල් පිටපත හෝ දෙවෙනි පිටපත වෙනුවට ඇතැම් අවස්ථාවලදී වෙනත් පිටපත් තැබීම.
27. උඩරට විවාහ සිදු කිරීම හා ලියාපදිංචි කිරීම ප්‍රමාද වීමේ ප්‍රතිඵල.
28. විවාහය පිළිබඳ හොඳම සාක්ෂිය විවාහය ලියාපදිංචි කිරීම බව.
29. උඩරට විවාහයක් ලියාපදිංචි කිරීමෙන් පසු සමහර කරුණු ඔප්පු කිරීම අනවශ්‍ය බව.
30. උඩරට විවාහ ලියාපදිංචි කිරීමට නො හැකි වීම සහ ලියා පදිංචි කිරීමේදී සිදු වූ වැරදි සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යොදන පිළිවෙළ.
31. කොට්ඨාශ වෙනස් කිරීමක් සිදුවූ විටක, උඩරට විවාහ පිළිබඳ විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීම සහ විවාහ සිදු කිරීම හා ලියාපදිංචි කිරීම.

IVවෙනි කාණ්ඩය

දික්කසාද

32. දික්කසාද වීමට අවශ්‍ය කරුණු.
33. දික්කසාද.
34. ඇපැල් ගැනීම.
35. උඩරට විවාහ අවලංගු කිරීම පිළිබඳ ආඥා හා සම්බන්ධවූ විශේෂ විධිවිධාන.
36. දික්කසාදයක් ලියාපදිංචි කිරීම ඒ පිළිබඳ හොඳ ම සාක්ෂිය බව.

V වෙනි කාණ්ඩය

පරිපාලනය පිළිබඳ සංවිධානය

37. රිජිස්ත්‍රාර් ජනරාල්.
38. උප රිජිස්ත්‍රාර් ජනරාල්.
39. දිස්ත්‍රික් ලේකම්වරු.
40. උඩරට පළාත් කොට්ඨාසවලට බෙදීම.
41. උඩරට විවාහ පිළිබඳ ලේකම්වරුන් පත් කිරීම.
42. නිලධාරීන්ගේ බලතල හා යුතුකම්.
43. කොට්ඨාස ලේකම්වරුන්ගේ නිවාසය, කාර්යාලය හා අතිරේක කාර්යාල.
44. කොට්ඨාස ලේකම්වරුන් කාර්යාලයට පැමිණීම ආදිය.
45. ලේකම්වරුන් විසින් තැබිය යුතු පොත්.
46. කොට්ඨාස ලේකම්වරුන්ගේ හා ඔවුන්ගේ කාර්යාල ආදිය පිළිබඳ නාම ලේඛන ප්‍රසිද්ධ කිරීම.
47. ව්‍යවස්ථා පැනවීමට ඇති බලය.

## VIවෙනි කාණ්ඩය

### සාමාන්‍ය


48. පරීක්‍ෂාව සඳහා පොත් ආදිය ඉදිරිපත් කිරීම.
49. ලේඛන ආදියේ භාරකාරත්වය.
50. ස්වකීය රාජකාර්‍ය්‍ය කාලය කෙළවර වීමේදී ලේකම්තැන ලේඛන ආදිය භාරදීම.
51. ලේඛනවල ලිපිදෝෂ ශුද්ධ කිරීම.
52. ලේඛන නැති කර දැමීම.
53. විභාග සම්බන්ධයෙන් ඇත්තාවූ බලතල.
54. ගාස්තු.


## VIIවෙනි කාණ්ඩය

### විවිධ කරුණු


55. විශේෂ කරුණු සකස් කර ගැනීම.
56. පොත් ආදියෙහි සහතික පිටපත්.
57. දැන්වීම් ආදිය භාර කරවීම.
58. වියදම්.
59. ගාස්තු යෙදවීම.


## VIIIවෙනි කාණ්ඩය

### වැරදි, දණ්ඩුවම් හා පදාර්ථ


60. බොරු ප්‍රකාශ ආදිය.
61. ලේඛන ආදිය නැති කර දැමීම.
62. අනිසි විවාහ ආදිය සිදු කිරීම.
63. ලේකම්වරුන්ගේ වැරදි.
64. දණ්ඩුවම්.
65. මහෙස්ත්‍රාත් උසාවියේ විභාග කළ හැකි වැරදි.
66. පදාර්ථ.


## IXවෙනි කාණ්ඩය

### අවලංගු කිරීම් හා තාවකාලික විධිවිධාන ආදිය


67. 96 සහ 97වෙනි පරිච්ඡේද අවලංගු කිරීම.
68. උඩරට විවාහ ආඥා පනත යටතේ තබන ලද ලේඛන පොත් ආදිය හා සම්පාදනය කරන ලද ව්‍යවස්ථා.
69. ඇතැම් විවාහ සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන අදාළ වන බව.
70. ඇතැම් විවාහ සඳහා IVවෙනි කාණ්ඩය අදාළ වීම.
71. මෙම ආඥා පනත යටතේ සිදුවන විවාහ සම්බන්ධයෙන් 98වෙනි පරිච්ඡේදය අදාළ නො විය යුතු බව.

# වර්ෂ 1952කේ අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද ආඥාපනත

**උඩරට විවාහ සහ දික්කසාද සම්බන්ධවූ නීතිය සංශෝධනය කොට ඒකාබද්ධ කිරීම පිණිසත්, ඒ හා සම්බන්ධවූ නොහොත් ඊට ආගන්තුකවූ කරුණු සඳහා විධිවිධාන සම්පාදනය කිරීම පිණිසත්, පනවන ලද ආඥා පනතකි.**

(අනුමත කළ දිනය : 1952 නොවැම්බර් 22වෙනි දින)

වර්තමාන පාර්ලිමේන්තුවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ උපදේශය හා අනුමතිය ඇතිව, එහි ම බලය පිට, නෛකශ්‍රීන් විරාජමාන මහා රාජිණිය විසින් මෙසේ පනවන ලදී :—

**1.** මෙම ආඥා පනත වර්ෂ 1952කේ අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද ආඥා පනත නමින් හැඳින්විය හැකිය. තවද, මෙම පනත, ගැසට් පත්‍රයේ ආඥාවක් ප්‍රසිද්ධ කිරීමෙන් අමාත්‍යවරයා විසින් නියම කළ හැකි, මින්පසු "නියමිත දිනය" යන්නෙන් හඳුන්වනු ලබන දිනයේදී වලංගු වනු ලැබේ. ලුහුඬු නාමය හා වලංගුවන දිනය.

2. මෙහි ඒ පිළිබඳව විශෙෂයෙන් පෙන්වා නොමැති කල්හි, නියමිත දිනයට ප්‍රථම සිදු කරන ලද විවාහ සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ විධිවිධාන අදාළ නො වන්නේ ය. පනත අදාළවීම

3. (1) මෙම ආඥාපනතේ විධිවිධානවලට යටත්ව— උඩරට නීතියට යටත්වූ පුද්ගලයන් අතර සිදුවන විවාහ.

(අ) උඩරට නීතියට යටත්වූ පුද්ගලයන් අතර සිදු වන විවාහයක්, මෙම ආඥා පනත යටතේ හෝ විවාහ ලියා පදිංචි කිරීමේ ආඥා පනත යටතේ හෝ සිදුකොට ලියා පදිංචි කරනු ලැබේ ; තවද,

(ආ) එසේ සිදු නො කොට ලියා පදිංචි නො කරන ලද එබඳු කවර විවාහයක් වුවද වලංගු නො වන්නේ ය.

(2) උඩරට නීතියට යටත් වන පුද්ගලයන් අතරේ සිදුවන විවාහයක්, විවාහ ලියා පදිංචි කිරීමේ ආඥා පනත යටතේ සිදු කොට ලියා පදිංචි කරනු ලැබීම, උඩරට නීතිය යටතේ හෝ එය අනුව හෝ දේපලක් උරුම කර ගැනීමට එම පුද්ගලයන් සතුව ඇති අයිතිවාසිකම් කෙරෙහි හෝ, එම පුද්ගලයන්ගෙන් හෝ එම පුද්ගලයන්ගේ මාර්ගයෙන් දේපලකට උරුම කම් කියන වෙනත් පුද්ගලයන් සතුව ඇති අයිතිවාසිකම් කෙරෙහි හෝ බල නො පානවා ඇත.

## Iවෙනි කාණ්ඩය

### උඩරට විවාහ පිළිබඳ සම්ප්‍රදාය සහ අවජාත දරුවන් සුජාත කරවීම

4. (1) විවාහය සිදුවන අවස්ථාවෙහි දී පහත සඳහන් කරුණු ඇති වුවහොත් කවර උඩරට විවාහයක් නමුදු වලංගු නොවන්නේය— විවාහය සඳහා නීත්‍යනුකූල වයස.

(අ) විවාහය සම්බන්ධවූ පුරුෂයාගේ වයස, විවාහය පිළිබඳ නීත්‍යනුකූල වයසින් අඩු වීම ;

(ආ) විවාහය සම්බන්ධවූ ස්ත්‍රියගේ වයස, විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසින් අඩු වීම ; නැතහොත්

(ඉ) විවාහය සම්බන්ධවූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම වයස, විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසින් අඩු වීම ද වේ.

(2) අංක (1) දරණ උපවගන්තියේ කෙසේ සඳහන්වී තිබුණ නමුදු, විවාහය සිදු වන අවස්ථාවේ දී ඒ හා සම්බන්ධවූ එක් පක්ෂයක් —එක් පක්ෂයක් පමණක්—විවාහ වීමේ නිත්‍යානුකූල වයසින් අඩුව සිටිය ද, පහත සඳහන් අවස්ථාවලදී උඩරට විවාහයක් අවලංගු වන ලෙස හෝ අවලංගු වූවක් ලෙස හෝ සලකනු නො ලැබේ—

(අ) යථෝක්ත පක්ෂය, විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසට පැමිණීමෙන් පසු එක් අවුරුද්දක කාලයක්, එම දෙපක්ෂය ස්වාමිපුරුෂයා හා භාර්‍යාව වශයෙන් සංවාසයේ යෙදීම ; නැතහොත්

(ආ) යථෝක්ත පක්ෂය විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසට පැමිණෙන්නට ප්‍රථම, එම විවාහයෙන් දරු උපතක් ඇතිවීම ද වේ.

(3) අංක (1) දරණ උපවගන්තියේ කුමක් සඳහන් වී තිබුණත්, විවාහය සිදුවන අවස්ථාවේදී ඒ හා සම්බන්ධවූ දෙපක්ෂය ම විවාහ වීමේ නිත්‍යානුකූල වයසින් අඩුව සිටිය ද, පහත සඳහන් අවස්ථාවලදී උඩරට විවාහයක් අවලංගු වන ලෙස හෝ අවලංගු වූවක් ලෙස හෝ සලකනු නො ලැබේ—

(අ) එබඳු දෙපක්ෂය ම විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසට පැමිණීමෙන් පසු එක් අවුරුද්දක කාලයක්, ස්වාමිපුරුෂයා හා භාර්‍යාව වශයෙන් සංවාසයේ යෙදීම ; නැතහොත්

(ආ) එම දෙපක්ෂය ම හෝ ඉන් එක් පක්ෂයක් හෝ විවාහය පිළිබඳ නිත්‍යානුකූල වයසට පැමිණෙන්නට ප්‍රථම එම විවාහයෙන් දරු උපතක් ඇති වීම ද වේ.

විවාහය සඳහා තහනම් වූ ඥාති සම්බන්ධතා.

5. (1) පහත සඳහන් අවස්ථාවලදී උඩරට විවාහයක් වලංගු නො වන්නේය—

(අ) විවාහයක් හා සම්බන්ධවූ පක්ෂ දෙකෙන් එක් පක්ෂයක් අනික් පක්ෂයෙන් කෙළින්ම පැවත එන්නකු වීම ;

(ආ) විවාහයක් හා සම්බන්ධ වූ ස්ත්‍රිය, මව්පිය දෙපාර්ශ්වයෙන් ම හෝ එක් පාර්ශ්වයකින් හෝ පුරුෂයාගේ සහෝදරිය වීම, නැතහොත් මව් පිය දෙපාර්ශ්වයෙන්ම හෝ එක් පාර්ශ්වයකින් හෝ ඔහුගේ සහොදරයාගේ හෝ සහෝදරියගේ දියණිය වීම, නැතහොත් ඒ දෙදෙනාගෙන් කෙනෙකුගෙන් පැවතෙන්නියක වීම, නැතහොත් වෙනත් පියකුට දාව ඔහුගේ භාර්‍යාවගෙන් උපන් දියණියක් වීම, නැතහොත් ඔහුගේ පුත්‍රයාගේ, මුණුබුරාගේ, පියාගේ හෝ ආතාගේ වැන්දඹුව වීම ;

(ඉ) විවාහයක් හා සම්බන්ධවූ පුරුෂයා, මව්පිය දෙපාර්ශ්වයෙන්ම හෝ එක් පාර්ශ්වයකින්, ස්ත්‍රියගේ සහෝදරයා වීම, නැතහොත් මව්පිය දෙපාර්ශ්වයෙන්ම හෝ එක් පාර්ශ්වයකින් ඇගේ සහෝදරයාගේ හෝ සහෝදරියගේ පුත්‍රයා වීම, නැතහොත් ඔවුන් දෙදෙනාගෙන් එක් කෙනෙකුගෙන් පැවතෙන්නකු වීම, නැතහොත් ඇගේ සවාමියාට ජාත වී වෙනත් මවකගෙන් උපන් පුත්‍රයෙකු වීම, නැතහොත් ඇගේ මිය ගිය දියණියගේ, මිණිබිරියගේ, මවගේ හෝ ආච්චිගේ සවාමිපුරුෂයා වීම ද වේ.

(2) මෙම වගන්තියේ අංක (1) දරණ උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ විස්තර වී ඇති ඥාති සම්බන්ධයකින් එක් එක් අයෙකු බැදී සිටින්නාවූ, උඩරට නීතියට යටත්වූ පුද්ගලයන් දෙදෙනෙකු අතරේ කිසිම විවාහයක් හෝ සංවාසයක් සිදු නො විය යුතුය. ඉදින් එබදු පුද්ගලයන් අතර විවාහයක් හෝ සංවාසයක් හෝ සිදුවුණි නම්, එබදු එක් එක් අයෙක් මෙම ආඥා පනත යටතේ වරදකට වැරදිකාරයා වන්නේය.

6. (අ) විවාහයක් හා සම්බන්ධවූ එක් පක්ෂයක් ඊට ප්‍රථම විවාහයකට ඇතුළත්වී ඇති විටක ; ප්‍රථම විවාහය නීත්‍යනුකූලව අවලංගු කරන තුරු දෙවැනි විවාහයක් වලංගු නොවන බව.

(ආ) එම ප්‍රථම විවාහය හා සම්බන්ධවූ අනික් පක්ෂය තවම ජීවත්ව සිටී නම්,

එකී ප්‍රථම විවාහය නීත්‍යනුකූල ලෙස අවලංගු කර ගන්නා තෙක් හෝ එකී විවාහය නීත්‍යනුකූල නො වන්නක් ලෙස ප්‍රකාශ කරනු ලබන තෙක් හෝ කිසිම උඩරට විවාහයක් වලංගු නො වන්නේය.

7. නීත්‍යනුකූල උඩරට විවාහයක් කරගනු ලැබූ විට, එකී විවාහයට සම්බන්ධවූ දෙපක්ෂය, විවාහයට පත් වන්නට ප්‍රථම, ඔවුන්ට ලැබී සිටි දරුවෝ (ඔවුන් ලැබුණේ නියමිත දිනයට පළමු හෝ පසුව හෝ වේවා) සුජාත බවට පත් වන්නාහ. එසේ සුජාත බවට පත්වූ දරුවන්ට, ඔවුන් එබඳු විවාහයකින් පසුව, එම දෙමවුපියන්ට ලැබුණාක් මෙන් ම එම අයිතිවාසිකම් ම හා සමානවූ අයිතිවාසිකම් ද හිමි වෙනවා ඇත. අවජාත දරුවන් සුජාත කරවීම.

## IIවෙනි කාණ්ඩය

### විවාහය සඳහා කැමැත්ත

8. (1) උඩරට නීතියට යටත්වූ අඩු වයස්කාරයකු මෙම පනත යටතේ විවාහයක් සිදු කර ගැනීමේදී, ඒ සඳහා සුදුසු බලධරයකුගේ කැමැත්ත අවශ්‍ය බැව් මෙයින් නියම කරනු ලැබේ. අඩුවයස්කාරයකුගේ විවාහය සඳහා කැමැත්ත අවශ්‍ය බව.

(2) මෙම ආඥා පනතේ කරුණු සඳහා අඩු වයස්කාරයකු සම්බන්ධයෙන් යෙදෙන "සුදුසු බලධරයා" යන්නෙන්, පහත සඳහන් කෙනෙකු අදහස් කරයි—

(අ) අඩුවයස්කාරයාගේ පියා,

(ආ) පියා මිය ගොස් නම් නැතහොත් ඔහු නීතිය පිළිබඳ කිසියම් අවහිරයකට යටත් වී සිටී නම් නැතහොත් ඔහු ලංකාවේ නො සිටීම හේතු කොට ගෙන කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමට නුපුළුවන් තත්වයක සිටී නම්, අඩුවයස්කාරයාගේ මව,

1*—J. N. R 37907 1,015 (7/53)

(ඉ) අවුවයස්කාරයාගේ පියා සහ මව යන දෙදෙන ම මිය ගොස් නම් නැතහොත් ඔවුහු නීතිය පිළිබඳ අවහිරයකට යටත් වී සිටිත් නම් නැතහොත් ඔවුහු ලංකාවේ නො සිටීම හේතු කොට ගෙන කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නුපුළුවන් තත්වයක සිටිත් නම්, පියා විසින් හෝ පියා මිය ගොස් නම් නැතහොත් නීතිය පිළිබඳ අවහිරයකට යටත්ව සිටී නම් මව විසින් හෝ ඉදින් මවත් මිය ගොස් නම් නැතහොත් නීතිය පිළිබඳ අවහිරයකට යටත්ව සිටී නම් නිසි බලය ඇති උසාවියක් මගින් පත්කරන ලද අවුවයස්කාරයාගේ භාරකාරයා හෝ භාරකාරයෝ, නැතහොත්

(ඊ) අවුවයස්කාරයාගේ පියා සහ මව යන දෙදෙනා ම මිය ගොස් නම් හෝ ඔවුහු නීතිය පිළිබඳ අවහිරයකට යටත්ව සිටිත් නම් හෝ ඔවුහු ලංකාවේ නො සිටීමේ හේතුවෙන් කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නුපුළුවන් තත්වයක සිටිත් නම්, හෝ, එසේම, එබඳු අවස්ථාවකදී—

(i) පියා විසින් හෝ මව විසින් හෝ නිසි බලය ඇති උසාවියක් මගින් හෝ අවුවයස්කාරයා වෙනුවෙන් භාරකාරයකු හෝ භාරකාරයන් පත් කර නැති කල්හි ; නැතහොත්

(ii) එසේ පත් කරන ලද භාරකාරයා හෝ භාරකාරයන් ද මිය ගොස් නම් හෝ ඔහු හෝ ඔවුහු නීතිය පිළිබඳව අවහිරයකට යටත්ව සිටිත් නම් හෝ ලංකාවේ නො සිටීමේ හේතුවෙන් කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නුපුළුවන් තත්වයක සිටිත් නම්,

අවුවයස්කාරයා පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන ද වේ.

කැමැත්ත දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය.

9. අවුවයස්කාරයකුගේ විවාහයක් සඳහා යටකී වගන්තිය යටතේ සුදුසු බලධරයකුගේ කැමැත්ත අවශ්‍යවූ කල්හි, තමාට සුදුසු යයි වැටහෙන පරිද්දෙන් එම කැමැත්ත දෙන්නට හෝ ප්‍රතික්ෂේප කරන්නට පූර්වෝක්ත බලධරයාට පිළිවන.

දිස්ත්‍රික් ලේකම් තැනගේ කැමැත්ත.

10. (1) අවුවයස්කාරයකු සම්බන්ධයෙන් තමා සුදුසු බලධරයකු වූ අවස්ථාවකදී, මෙම ආඥා පනත යටතේ අවුවයස්කාරයකුගේ විවාහයට තමාගේ කැමැත්ත පතා කරන ලද කිසියම් ඉල්ලීමක් වෙතොත්, දිස්ත්‍රික් ලේකම්තැන එය භාරගෙන ක්‍රියා කළ යුතුය.

(2) ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක්, යථෝක්ත අවුවයස්කාරයා විසින් හෝ අවුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උනන්දුවක් ඇත්තාවූ සෙසු පුද්ගලයකු විසින් හෝ ලේඛිත පෙත්සමක මාර්ගයෙන් කළ යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් සපයනු ලබන නියමිත වටිනාකමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර, පෙත්සමෙහි අලවා තිබිය යුතු ය.

(4) පෙත්සම පහත සඳහන් පරිදි පිළියෙළ විය යුතු ය—

(අ) එය, නියමිත ආකෘති පත්‍රයට අනුව සම්පාදනය විය යුතු ය.

(ආ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ප්‍රකාශ කළ යුතු ය.

(ඉ) ඉල්ලුම්කරු එම ඉල්ලීම කරන්නේ කවර තත්ත්වයකින්ද යන බව ප්‍රකාශ කළ යුතු ය ;

(ඊ) ඉදින් ඉල්ලුම්කරු, අබුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගය දක්වන්නකු පමණක් ම නම්, අබුවයස්කාරයාගේ නම සහ ලිපිනය ප්‍රකාශ කළ යුතු ය ;

(උ) නියම කළ හැකි වෙනත් තොරතුරුවලින් සමන්විත විය යුතු ය ;

(ඌ) ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතු ය.

(5) පෙත්සම ලැබුණු වහා ම දිස්ත්‍රික් ලේකම්තැන විසින් ඉල්ලුම්කරු වෙත දැන්වීමක් භාර කරවිය යුතු ය. ඉදින් ඉල්ලුම්කරු, අබුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත් වූ කෙනෙකු පමණක් ම නම්, අබුවයස්කාරයා වෙත දැන්වීම භාර කරවිය යුතු ය.

(6) එම දැන්වීමෙහි—

(අ) එම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර නිම කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තැන එහි විස්තර කර ඇති දින යක හා වේලාවකදී තමාගේ කාර්යාලයට හෝ එහි විස්තර කළ හැකි වෙනත් ස්ථානයකට හෝ පැමිණෙන බව සඳහන් කළ යුතු ය ; එසේම

(ආ) එසේ දන්වන ලද දිනයේ දන්වන ලද වේලාවට, දන්වන ලද ස්ථානයේදී, සාක්ෂිකරුවන් ඇතොත් ඒ සාක්ෂිකරුවන් ද කැටුව, දිස්ත්‍රික් ලේකම්තැන ඉදිරියේ පෙනී සිටින ලෙස දැන්වීම යවා තිබෙන පුද්ගලයාට නියම කළ යුතු ය.

(7) යථොක්ත දැන්වීමේ ප්‍රකාශවූ දිනයට හා වේලාවට එහි ප්‍රකාශ වූ ස්ථානයට පැමිණ, අවශ්‍ය යයි තමාට හැඟෙන අන්දමින් ලුහුඬු විභාගයක් එම දිනයේදී ම හෝ කල් තබන ලද වෙන කවර දිනයක දී හෝ පවත්වා, පූර්වොක්ත ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර නිමවීම දිස්ත්‍රික් ලේකම්තැන විසින් කළ යුතු ය. එම විභාගයේ නිර්ණය ඉල්ලුම්කරු වෙත ද, ඉදින් ඉල්ලුම්කරු අබුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත්වූ කෙනෙකු පමණක් ම නම්, අබුවයස්කාරයා වෙතද, දිස්ත්‍රික් ලේකම්තැන විසින් ලියවිල්ලකින් දැන්විය යුතු ය.

(8) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර නිම වන්නට ප්‍රථම, ඉල්ලුම්කරුටත්, ඉදින් ඉල්ලුම්කරු අබුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත් වූ කෙනෙකු පමණක් ම නම් අබුවයස්කාරයාටත්, ඔවුන්ට සාක්ෂිකරුවන් සිටිතොත් ඒ සාක්ෂිකරුවන්ටත් ස්වකීය අදහස් දැක්වීමට අවස්ථාව දිස්ත්‍රික් ලේකම්තැන විසින් සලස්වා දිය යුතු ය.

(9) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර නිමවීම සඳහා මෙම වගන්තිය යටතේ පවත්වන ලද විභාගවල විස්තර, දිස්ත්‍රික් ලේකම්තැන විසින් සටහන් පොතක සටහන් කර තැබිය යුතු ය.

11 (1) මෙම ආඥා පනත යටතේ අබුවයස්කාරයකුගේ විවාහයට කැමැත්ත ලබා ගැනීම සඳහා සුදුසු බලධරයකු වෙතින් කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ කල්හි, එම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව, යථොක්ත අබුවයස්කාරයා පදිංචිව සිටින ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියකට ඇපැල් ගත හැකි ය. ඇපැල්.

(2) අඹුවයස්කාරයා විසින් හෝ අඹුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත්වූ අන්කිසි පුද්ගලයකු විසින් හෝ ලේඛිත පෙත්සමක මාර්ගයෙන් ඇපැල ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුවද, යම් අඹුවයස්කාරයකු සම්බන්ධයෙන් සුදුසු බලධරයකු හැටියට දිස්ත්‍රික් ලේකම්තැන විසින් කරන ලද ප්‍රතික්ෂෙප කිරීමකට විරුඬව, අඹුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත්වූ කෙනෙකු හැටියට පමණක් පෙනී සිටින පුද්ගලයකුට ඇපැල් ගත හැක්කේ, කැමැත්ත පතා කරන ලද මුල් ඉල්ලීම ද ඔහු විසින් ම කරන ලද්දේ නම් පමණකි.

(3) ඇපැල්කාරයා විසින් සැපයිය යුතු නියමිත වටිනා කමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර ඇපැල් පෙත්සමට අලවා තිබිය යුතු ය.

(4) ඇපැල් පෙත්සම පහත සදහන් පරිදි පිළියෙළ විය යුතු ය—

(අ) එය නියමිත ආකෘති පත්‍රයේ ආකාරයෙන් පිළියෙළ විය යුතු ය;

(ආ) ඇපැල්කාරයාගේ නම සහ ලිපිනය ප්‍රකාශ කළ යුතු ය;

(ඉ) යම් සුදුසු බලධරයකුගේ තීරණයකට විරුඬව ඇපැල් ගනු ලැබේ ද එම සුදුසු බලධරයාගේ නම සහ ලිපිනය ප්‍රකාශ කළ යුතු ය;

(ඊ) තමා ඇපැල් ගන්නේ කවර කාරණයකින්ද යන බව ප්‍රකාශ කළ යුතු ය;

(උ) ඇපැල්කාරයා අඹුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උදෙ‍්‍යාගවත්වූ කෙනෙකු පමණක් ම නම්, අඹුවයස්කාරයාගේ නම සහ ලිපිනය ප්‍රකාශ කළ යුතු ය;

(ඌ) නියම කළ හැකි වෙනත් තොරතුරු අඩංගු විය යුතුය;

(එ) ඇපැල්කාරයා විසින් අත්සන් කොට තිබිය යුතු ය.

(5) සුදුසු බලධරයකු හැටියට දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් කරන ලද ප්‍රතික්ෂෙප කිරීමකට විරුඬව මෙම වගන්තිය යටතේ ඇපැල් ගන්නා කල්හි, පළමුකොට එම ලේකම්තැන වෙත ඇපැල් පෙත්සම ඉදිරිපත් කළ යුතුය. එම පෙත්සම ලැබූ කෙනෙහි ම, ඉහත කී වගන්තිය යටතේ එකී කාරණය පිළිබඳව තමා විසින් තබන ලද සටහන් පොත ද සමග එම දිස්ත්‍රික් ලේකම්තැන විසින් ඉහත කී පෙත්සම දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කළ යුතු ය.

ඇපැල් සම්බන්ධයෙන් උසාවියට ඇති බලය.

12. (1) අඹුවයස්කාරයකුගේ විවාහය සඳහා කැමැත්ත පතා මෙම ආඥා පනත යටතේ කරන ලද ඉල්ලීමක් සුදුසු බලධරයකු විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබීමකට විරුඬව ගන්නා ලද ඇපැලකදී, අංක (2) දරණ උපවගන්තියට යටත්ව, උසාවියේ පරම අභිමතය පරිදි—

(අ) එබඳු බලධරයකුගේ තීරණය ස්ථිර කරමින්; හෝ

(ආ) එම තීරණය අවලංගු කොට විවාහයට කැමැත්ත ප්‍රකාශය කරමින්; හෝ

ආඥාවක් කිරීමට දිස්ත්‍රික් උසාවියකට පිළිවන.

(2) මෙම ආඥා පනත යටතේ අඹුවයස්කාරයකුගේ විවාහයට කැමැත්ත දීම සම්බන්ධයෙන් සුදුසු බලධරයකු විසින් කරන ලද ප්‍රතික්ෂෙප කිරීම සාධාරණ නො වේ යයි උසාවියට ඒත්තු ගියහොත් මිස, (1) උපවගන්තියේ (ආ) ශීර්ෂය යටතේ දිස්ත්‍රික් උසාවියක් විසින් ආඥාවක් නො කළ යුතු ය.

(3) එම ආඥාවේ පිටපතක්, ඇපෑල්කාරයාටත්, සුදුසු බලධරයාටත්, ඉදින් ඇපෑල්කාරයා අඩුවයස්කාරයාගේ විවාහය සම්බන්ධයෙන් උද්‍යෝගවූ කෙනෙකු පමණක් ම නම් අඩුවයස්කාරයාටත් දිස්ත්‍රික් උසාවිය විසින් භාර කරවිය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ ගන්නා ලද කවර ඇපෑලක් සම්බන්ධයෙන් වුව ද දිස්ත්‍රික් උසාවියක තීරණය අවසානවූත් තීරණාත්මකවූත් තීරණය වන අතර, එම තීරණය ඇපෑලකට යටත් නොවන්නේ ය.

පක්‍ෂවලට සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දිය යුතු බව.

13. මෙම කාණ්ඩය යටතේ ගන්නා ලද කවර ඇපෑලක් සම්බන්ධයෙන් වුවද තීරණයක් දී අවසාන කරන්නට පෙර, ඇපෑල සම්බන්ධ වූ විවාහයේ අඩුවයස්කාරයා ඇතුළු ඇපෑලේ පාර්ශවකාරයින්ට ද, ඔවුන්ට සාක්ෂිකරුවන් සිටිතොත් ඔවුන්ට ද තම තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට ප්‍රස්ථාවක් දිස්ත්‍රික් උසාවියක් මගින් සලස්වා දිය යුතු ය.

ඇපෑල් ඇසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.

14. මෙහි මුලින් සඳහන් කරන ලද විධිවිධාන හැරුණු විට ද, මෙම ආඥා පනතේ කටයුතු සඳහා අධිකරණ පනත යටතේ සම්පාදනය කර ගැනීමට මෙයින් බලය දෙනු ලබන යම්කිසි නියෝග වලට යටත්ව ද, මෙම කාණ්ඩය යටතේ දිස්ත්‍රික් උසාවියකට ගනු ලබන ඇපෑලක් විභාග කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය වූකලී, සාමාන්‍ය වශයෙන් හෝ යම් විශෙෂ අවස්ථාවක් සම්බන්ධයෙන් හෝ එම උසාවිය විසින් නියම කරනු ලබන ක්‍රියා පරිපාටිය වන්නේ ය.

උසාවියේ ආඥාවක ප්‍රතිඵලය.

15. මෙම කාණ්ඩය යටතේ ගන්නා ලද ඇපෑලකදී, සුදුසු බලධරයකුගේ තීරණයක් අවලංගු කොට අඩුවයස්කාරයකුගේ විවාහයට කැමැත්ත දෙමින් දිස්ත්‍රික් උසාවියක් විසින් ආඥාවක් කරනු ලබන කල්හි, මෙම ආඥා පනත යටතේ එම අඩුවයස්කාරයාගේ විවාහය සඳහා යථොක්ත සුදුසු බලධරයාගෙන් ලැබිය යුතු කැමැත්ත, ඉහත කී ආඥාව කරනු ලැබූ දිනයේ පටන් දෙනු ලැබූ ලෙස, මෙම ආඥා පනතේ සියලු ම කරුණු සම්බන්ධයෙන් සලකනු ලැබේ.

## IIIවෙනි කාණ්ඩය

## උඩරට විවාහ ලියාපදිංචි කිරීම

උඩරට විවාහ කර ගැනීමේදී ඒ ගැන දැනුම් දීම.

16. සිදු කිරීමට බලාපොරොත්තුව සිටින සෑම උඩරට විවාහයක් ම, මෙහි පහත ඒ පිළිබඳව නියම කරනු ලබන්නාවූ නිසි ලේකම්තැන වෙත, මින්මතු විස්තර කරනු ලබන පරිද්දෙන්, දැන්වීමක් භාර කරවීමෙන් දැනුම් දිය යුතු ය—

(1) විවාහාපෙක්‍ෂක දෙපක්‍ෂය ම දැන්වීම භාර කරවීමට පෙර දින දහයකට අඩු නැති කාලයක් එක ම කොට්ඨාශයේ පදිංචිව සිටියාහු නම්, එම කොට්ඨාශයේ, කොට්ඨාශ ලේකම්තැන වෙත හෝ එම කොට්ඨාශය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන වෙත හෝ එක් පක්‍ෂයක් විසින් විවාහය පිළිබඳ දැන්වීම භාර කරවිය යුතු ය.

(2) දෙපක්‍ෂය ම මෙම වගන්තියේ අංක (1) දරණ ඡේදයේ සඳහන් කාලසීමාව ඇතුළත කොට්ඨාශ දෙකක පදිංචිව සිටියාහු නම්, ඒ ඒ පක්‍ෂය විසින් එසේ පදිංචිව සිටි කොට්ඨාශයේ, කොට්ඨාශ ලේකම්

තැන වෙත හෝ ඒ කොඨාශය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන වෙත හෝ විවාහය පිළිබඳ දැන්වීම් භාර කරවිය යුතු ය.

එසේ වුවද, එබඳු කොඨාශ දෙක ම පිහිටියේ එක ම දිස්ත්‍රික්කයේ නම්, මෙම වගන්තියේ ඉහත දක්වූ විධිවිධාන යටතේ විවාහය පිළිබඳ දැන්වීම එම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන වෙත, එක් එක් පක්ෂය විසින් දන්වනු වෙනුවට, එබඳු එක් පක්ෂයක් විසින් දිස්ත්‍රික් ලේකම්තැන වෙත දැන්විය යුතු ය.

(3) මෙම වගන්තියේ අංක (1) දරන ඡේදයේ සඳහන් කාලයක්, විවාහය හා සම්බන්ධවූ එක් පක්ෂයක් පමණක් කිසියම් කොඨාශයක පදිංචිව සිටි අවස්ථාවකදී, එම පක්ෂය විසින් විවාහය පිළිබඳ දැන්වීම එම කොඨාශයේ කොඨාශ ලේකම් තැන වෙත හෝ එම කොඨාශය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන වෙත හෝ භාර කරවිය යුතු ය.

(4) මෙම වගන්තියේ අංක (1) දරන ඡේදයේ සඳහන් කාලයක්, විවාහය හා සම්බන්ධවූ පක්ෂ දෙක ම, එක ම කොඨාශයක පදිංචිව නො සිටි අවස්ථාවකදී, ඉදින් එයින් එක් පක්ෂයක්, පූර්වෝක්ත දැන්වීම භාර කරවන දිනයෙන් මෙපිට දින හතරකට අඩු නැති දින ගණනක් කොඨාශයක ජීවත්ව සිටියේ නම්, එකී පක්ෂය විසින් එම කොඨාශයේ කොඨාශ ලේකම්තැන වෙත හෝ එම කොඨාශය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන වෙත හෝ විවාහය පිළිබඳ දැන්වීම භාර කරවිය යුතු ය.

(5) විවාහයක් පිළිබඳ එක් පක්ෂයක් ලංකාවෙහි නො සිටි අවස්ථාවකදී, එම පක්ෂය ලංකාවට පැමිණීමේ බලාපොරොත්තුවෙන්, මෙම වගන්තියේ අංක (3) හෝ (4) දරන ඡේද යටතේ විවාහය පිළිබඳ දැන්වීමක් දීමට අනික් පක්ෂයට පිළිවන.

(6) එම දැන්වීම නියමිත ආකෘතියට සාරානුකූලව පිළියෙල විය යුතුය. තවද එම දැන්වීමෙහි—

(අ) (i) විවාහය හා සම්බන්ධවූ එක් එක් පක්ෂයේ සම්පූර්ණ නම්, (දෙනු ලබන නම සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන නමට වෙනස් නම්, පාවිච්චි කරනු ලබන නම ද ඇතුළත් කළ යුතු යි) වයස, රක්ෂාව හෝ වෘත්තිය, තත්ත්වය (අවිවාහක ද, කණවැන්දුම් ද නැතහොත් දික්කසාදවී ද යන වග) සහ පදිංචි ස්ථානය ද;

(ii) විවාහයේ ආකාරය (බින්න විවාහයක් ද, දීග විවාහයක් ද යන බව); සහ

(iii) එබඳු ලේකම් තැනගේ කොඨාශයේ හෝ දිස්ත්‍රික්කයේ ඒ ඒ පක්ෂය පදිංචි ව සිටි කාලය ද;

ප්‍රකාශ කළ යුතු ය.

(ආ) මෙම ආඥාපනත යටතේ එම විවාහයට යම් පුද්ගලයකුගේ කැමැත්ත අවශ්‍ය නම්, එකී කැමැත්ත එහි ම ලියා ප්‍රකාශ කළ යුතුය නැතහොත් කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් ඊට අමුනා තිබිය යුතුයි;

(ඉ) මෙම වගන්තියේ අංක (7) දරන ඡේදය යටතේ කරන ලද ප්‍රකාශයකුත්, මෙම වගන්තියේ අංක (0) දරණ ඡේදය යටතේ කරන ලද පෘෂ්ඨාංකනයක සහතිකයකුත් ඇතුළත් කොට තිබිය යුතු ය;

(ඊ) දැන්වීම භාර කරවන පක්ෂය විසින් සපයන ලද නියමිත වට්ටෝරුකමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර අමුණා තිබිය යුතු ය;

(උ) එම පක්ෂය විසින් අත්සන් කොට තිබිය යුතු ය.

(7) විවාහයක් හා සම්බන්ධ වන පක්ෂයක්, ඒ පිළිබඳ දැන්වීම ලේකම්තැනට භාර කරවන්නට ප්‍රථම, ලේකම් හමුවෙහි තමා ම පෙනී සිට, ලේකම් තැන හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ පහත සඳහන් කරුණු ඇතුළත් ප්‍රකාශයක් කොට අත්සන් තැබිය යුතු ය. එකී කරුණු නම්—

(අ) දැන්වීමේ ප්‍රකාශ කොට ඇති තොරතුරු එම පක්ෂය හොඳින් ම දන්නා හැටියට හා විශ්වාස කරන හැටියට සත්‍ය බව හා නිවැරදි බව;

(ආ) එම විවාහය සම්බන්ධයෙන් නීත්‍යනුකූල බැඳීමක් හෝ වෙනත් නීත්‍යනුකූල බාධකයක් නැති බව;

(ඉ) ඒ හා සම්බන්ධවූ පක්ෂ දෙකෙන් කිසිවකු අඩු වයස්කාරයකු නො වන බව හෝ දෙපක්ෂය ම අඩු වයස් කාරයන් බව හෝ එක් පක්ෂයක් අඩු වයස් කාරයකු බව;

(ඊ) මෙම ආඥාපනත යටතේ එම විවාහයට කිසියම් පුද්ගලයකුගේ කැමැත්ත අවශ්‍ය බව හා එම කැමැත්ත ලබා ගෙන තිබෙණ බව හෝ එම විවාහය සඳහා මෙම ආඥාපනත යටතේ කිසිවකුගේ කැමැත්තක් අවශ්‍ය නො වන බව ද වේ.

(8) මෙම සාක්ෂිකාරයින් එම පක්ෂය පුද්ගලික වශයෙන් දන්නා වුන් විය යුතු ය. එකී පක්ෂය ලේකම් තැන නාඳුනන විට, ඔවුන් ලේකම් තැන විසින් පුද්ගලික වශයෙන් දැන සිටිය යුතු ය. ඒ ඒ සාක්ෂිකාරයාගේ සම්පූර්ණ නම, රක්ෂාව හෝ වෘත්තිය සහ පදිංචි ස්ථානය යථෝක්ත ප්‍රකාශයේ පාදයෙහි සටහන් කළ යුතු ය.

(9) මෙම ප්‍රකාශය කර එම පක්ෂය අත්සන් තැබීමෙන් පසු ලේකම් තැන විසින් පහත සඳහන් පෘෂ්ඨාංකනය ප්‍රකාශයේ පාදයෙහි සහතික කළ යුතු ය. එනම්—

(අ) එම පක්ෂය ලේකම්තැන නො දන්නා බව හා සාක්ෂිකාරයන් ලේකම් තැන දන්නා බව, නො එසේ නම් එම පක්ෂය ලේකම් තැන දන්නා බව;

(ආ) එම පක්ෂය තමන් පුද්ගලිකව දන්නා බව සාක්ෂිකාරයන් තමා ඉදිරියේ ප්‍රකාශ කර තිබෙණ බව; සහ

(ඉ) එම පක්ෂය විසින් ලේකම් තැන ඉදිරියේ එම ප්‍රකාශය කොට අත්සන් තැබූ බවත් ය.

උඩරට විවාහ පිළිබඳ දැන්වීම ඇතුළත් කිරීම හා ප්‍රසිද්ධ කිරීම.

17. යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් පිළිබඳ දැන්වීමක් තමාවෙත භාර කරවනු ලැබූ වහාම, ලේකම් කෙනෙකු විසින් පහත සඳහන් විධිවිධාන ඉටු කළ යුතු ය—

(අ) ලේකම් තැන එම දැන්වීම අමුනා සවකීය කාර්යාලයේ සටහන් පොත් සමග තැන්පත් කර තැබිය යුතු ය;

(ආ) දැන්වීමේ සඳහන් නියමිත අන්දමේ තොරතුරු, ලේකම්තැන විසින් සවකීය විවාහ දැන්වීම් ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු ය. (මීට මින් පසු " විවාහ දැන්වීම් සටහන " යයි කියනු ලැබේ);

(ඉ) එම දැන්වීමේ සැබෑ පිටපතක් හෝ එම දැන්වීමෙන් නියමිත ඛණ්ඩයක්, එම විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට යටත් පිරිසෙයින් නො කඩවා දින දෙළසක් ස්වකීය කාර්යාලයේ පහසු ලෙස පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කිරීමෙන් හෝ ප්‍රදර්ශනය කරන්නට සැලැස්වීමෙන් ලේකම්තැන විසින් යථෝක්ත දැන්වීම ප්‍රසිද්ධ කළ යුතු ය;

(ඊ) අංක 16 දරණ වගන්තියේ අංක (2) දරණ ඡේදයේ සඳහන් කාල සීමාවක්, විවාහය හා සම්බන්ධ වන දෙපක්ෂය අන් අන් කොට්ඨාශවල වාසය කොට තිබුණි නම්, ඉදින් ලේකම් තැන—

(i) කොට්ඨාශ ලේකම් කෙනෙකු නම්, නැතහොත්,

(ii) දිස්ත්‍රික් ලේකම් කෙනෙකුවී, එබඳු කොට්ඨාශවලින් එකක් ඔහුගේ දිස්ත්‍රික්කයේ පිහිටා නැත්නම්,

එම දැන්වීම භාර කරවූ පක්ෂයට යථෝක්ත දැන්වීමේ සහතික පිටපතක් ලේකම් තැන විසින් සැපයිය යුතු ය.

උඩරට විවාහ පිළිබඳව සහතික නිකුත් කිරීම.

18. යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් පිළිබඳ දැන්වීමක් මෙම ආඥාපනත යටතේ ලේකම් කෙනෙකු වෙත භාර කරවා ඇති යම් අවස්ථාවකදී, පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය—

(1) එම විවාහය හා සම්බන්ධ වන පක්ෂයක් ඒ සඳහා ඉල්ලුම් කළ කල්හි, මෙහි මින්මතු දක්වෙන විධිවිධානවලට යටත්ව, එම විවාහය පිළිබඳ වූ යථෝක්ත පක්ෂයට, ලේකම් තැන විසින් සහතිකයක් නිකුත් කළ යුතුය. (එම සහතිකයට මින්මතු "විවාහ දැන්වීම් සහතිකය" යයි කියනු ලැබේ).

(2) පහත සඳහන් අවස්ථාවලදී ලේකම් තැන විසින් විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් නො කළ යුතු ය—

(අ) සහතිකයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් නීත්‍යනුකූල අවහිරයක් හෝ වෙනත් නීත්‍යනුකූල බාධකයක් තමාට පෙන් වනු ලැබීම;

(ආ) ලේකම් තැන දිස්ත්‍රික් ලේකම් කෙනෙකු නම්, සහතිකයක් නිකුත් කිරීමට විරුද්ධත්වය දක්වීමක් මෙම ආඥාපනත යටතේ ඔහු වෙත ඉදිරිපත් කර තිබීම, එහෙත් අංක 21 දරණ වගන්තිය යටතේ එම විරුද්ධත්වය යටපත් කරමින් තමා විසින් නියෝගයක් කර නො තිබිය යුතු ය; නැතහොත්

(ඉ) ලේකම් තැන කොට්ඨාශ ලේකම් කෙනෙකු නම්, එබඳු විරුද්ධතාවක් ඔහු වෙත ඉදිරිපත් කර තිබීම, එහෙත් එම විරුද්ධතාවය යටපත් කෙරෙමින් අංක 21 දරණ වගන්තිය යටතේ කරන ලද නියෝගයක සහතික පිටපතක් තමාට ලැබී නො තිබිය යුතු ය.

(3) විවාහයක් සම්බන්ධයෙන් අංක 10 දරණ වගන්තියේ අංක (1) දරණ ඡේදය හෝ අංක (3) දරණ ඡේදය හෝ අංක (4) දරණ ඡේදය හෝ අදාළ වන කල්හි—

(අ) ඉදින් ලේකම් තැන දිස්ත්‍රික් ලේකම් කෙනෙකු නම්,

පහත සඳහන් අවස්ථාවලදී විවාහ දැන්වීම් සහතිකය නිකුත් නො කළ යුතු ය. එනම්—

(i) යථෝක්ත විවාහය සඳහා ඔහු විසින් විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට දින දෙළහක කාලයක් ඉකුත් වීමට ප්‍රථම, එහෙත්, එම විවාහය හා සම්බන්ධ වන පක්ෂයක් ඒ සඳහා ඉල්ලීමක් කොට, මෙම වගන්තියේ අංක (5) දරණ ඡේදයෙන් අවශ්‍ය වන ප්‍රකාශයක් කොට අත්සන් කරන ලද්දේ නම් මෙය අදාළ නො වන්නේ ය, නැතහොත්

(ii) එම දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමෙන් පසුව ද වේ.

(ආ) තවද, ලේකම් තැන කොස්ශ ලේකම් කෙනෙකු නම්, පහත සඳහන් අවස්ථාවලදී ඔහු විසින් විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් නො කළ යුතු ය. එනම්—

(i) යථෝක්ත විවාහය සඳහා ඔහු විසින් විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට දින දෙළසක කාලයක් ඉකුත් වීමට ප්‍රථම, එහෙත් අංක 19 දරණ වගන්තිය යටතේ නිකුත් කරන ලද විශෙෂ බලපත්‍රයක් යටතේ නම්, එය කළ හැකිය, නැතහොත්

(ii) එම දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමෙන් පසුව ද වේ.

(4) විවාහය සම්බන්ධයෙන් අංක 16 දරණ වගන්තියේ (2) ඡේදයේ විධිවිධාන අදාළ වූ විටක දී ලේකම් තැන—

(අ) ඉදින් තමා, පූර්වොක්ත ඡේදයේ සඳහන් කාල සීමාවක් ඇතුළත විවාහය හා සම්බන්ධ වන දෙපක්ෂය ම පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු නම්, පහත සඳහන් අවස්ථාවලදී විවාහ දැන්වීම් සහතිකය නිකුත් නො කළ යුතු ය—

(i) යථෝක්ත විවාහය සඳහා ඔහු විසින් විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට දින දෙළසක් ඉකුත් වන්නට ප්‍රථම; එහෙත්, එම විවාහය හා සම්බන්ධ වන පක්ෂයක් ඒ සඳහා ඉල්ලීමක් කොට මෙම වගන්තියේ අංක (5) දරණ ඡේදයෙන් අවශ්‍ය වන ප්‍රකාශය කොට අත්සන් කරන ලද්දේ නම් මෙය අදාළ නොවන්නේ ය.

(ii) නැතහොත් එම දිනයෙන් මාස තුනක කාලයක් ඉකුත් වීමෙන් පසුව ද වේ.

(ආ) ඉදින් ඔහු කොස්ශ ලේකම් කෙනෙකු නම්, පහත සඳහන් අවස්ථාවලදී විවාහ දැන්වීම් සහතිකය නිකුත් නො කළ යුතු ය—

(i) එම ඡේදය යටතේ යථෝක්ත විවාහය පිළිබඳව සෙසු කිසියම් ලේකම් කෙනෙකු

වෙත භාර කර වන ලද දැන්වීමක සහතික පිටපතක් ඉදිරිපත් කරනු නො ලැබූ අවස්ථාවක් ; නැතහොත්

(ii) යථෝක්ත විවාහය සඳහා ඔහු විසින් විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට හෝ, එබඳු සෙසු කිසියම් ලේකම් කෙනෙකු වෙත විවාහ දැන්වීම් සටහනක් ඇතුළත් කළ දිනයේ සිට හෝ දින දෙළසක් ඉකුත් වන්නට පෙර ; (මේ දින දෙකෙන් පසුව පැමිණෙන දිනය ගත යුතු ය). එහෙත් අංක 10 දරණ වගන්තිය යටතේ නිකුත් කරන ලද විශෙෂ බල පත්‍රයක බලය පිට හෝ යථෝක්ත විවාහය සම්බන්ධයෙන් එබඳු සෙසු ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකයක් ඉදිරිපත් කළ හොත් හෝ එය කළ හැකි ය.

(iii) මෙම ඡේදයේ ඉහත කී අනුඡේදයේ සඳහන් වූ දින දෙක අතුරෙන් පළමු කොට පැමිණෙන දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමෙන් පසුව ද වේ.

(ඉ) ඉදින්, එම ලේකම් තැන, එම ඡේදයේ සඳහන් කාල පරිච්ඡේදය තුළ එම විවාහය හා සම්බන්ධ වන එක් පක්ෂයක් පමණක් පදිංචි ව සිටියා වූ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු නම්, පහත සඳහන් අවස්ථාවලදී ඔහු විසින් විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් නො කළ යුතු ය.

(i) එම ඡේදය යටතේ සෙසු කිසියම් ලේකම් කෙනෙකු වෙත භාර කර වන ලද විවාහ දැන්වීමක සහතික පිට පතක් ඉදිරිපත් කරනු නො ලැබූ අවස්ථාවක් ;

(ii) යථෝක්ත විවාහය සඳහා ඔහු විසින් විවාහ දැන්වීම් සටහන ඇතුළත් කළ දිනයේ සිට හෝ එබඳු සෙසු කිසියම් ලේකම් කෙනෙකු වෙත විවාහ දැන්වීම් ඇතුළත් කිරීමක් කළ දිනයේ සිට හෝ දින දෙළසක් ඉකුත් වන්නට පෙර ; (මේ දින දෙකෙන් පසුව පැමිණෙන දිනය ගත යුතු ය). එසේම, එම විවාහය හා සම්බන්ධ වන පක්ෂයක් ඒ සඳහා ඉල්ලීමක් කොට මෙම වගන්තියේ අංක (5) දරණ ඡේදයෙන් අවශ්‍ය වන ප්‍රකාශය ද කොට අත්සන් කරන ලද්දේ නම් නැතහොත් යථෝක්ත විවාහය සම්බන්ධයෙන් එබඳු සෙසු ලේකම් කෙනෙකු විසින් නිකුත් කරනු ලබන විවාහ දැන්වීම් සහතිකයක් ඉදිරි පත් කරන ලද්දේ නම් මෙය අදාළ නො වන්නේ ය ; නැතහොත්

(iii) ඉහත කී අනුඡේදයේ සඳහන් වූ දින දෙක අතුරෙන් පළමු කොට පැමිණෙන දිනයේ සිට මාස තුනක කාලයක් අතික්‍රාන්ත වීමෙන් පසුව ද වේ.

(5) මෙම වගන්තියේ අංක (3) (අ) (i) දරණ ඡේදයේ හෝ අංක (4) (අ) (i) දරණ ඡේදයේ හෝ අංක (4) (ඉ) (ii) දරණ ඡේදයේ හෝ සඳහන් කාල සීමාව ඉකුත් වීමට ප්‍රථම දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගෙන් විවාහ දැන්වීම් සහතිකයක් ලබා ගන්නට කැමැත්තාවූ, විවාහයක් හා සම්බන්ධය ඇති කිසියම් පක්ෂයක් සිටිතොත්, එම පක්ෂය එම ලේකම්තැන ඉදිරියේ තමා ම පෙනී සිට, පහත සඳහන් කරුණු ඇතුළත් ප්‍රකාශයක් කොට අත්සන් තැබිය යුතු ය:—

(i) විවාහය සම්බන්ධයෙන් නීත්‍යනුකූල අවහිරයක් හෝ වෙනත් නීත්‍යනුකූල බාධකයක් නැති බව ද,

(ii) මෙම ආඥා පනත යටතේ එම විවාහය සඳහා කිසියම් පුද්ගලයකුගේ කැමැත්ත අවශ්‍ය බව හා ඒ කැමැත්ත ලබා ගෙන තිබෙණ බව ද නැතහොත් මෙම ආඥා පනත යටතේ එම විවාහය සිදු කිරීම සඳහා කිසිම පුද්ගලයකු ගේ කැමැත්තක් අවශ්‍ය නො වන බව ද වේ.

ප්‍රකාශය කරන පක්ෂය විසින් සැපයිය යුතු නියමිත වටිනාකමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර එම ප්‍රකාශයට අමුණා තිබිය යුතු ය.

(6) මෙම වගන්තිය යටතේ ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකයක් පහත සඳහන් පරිදි පිළියෙළ විය යුතු ය—

(අ) එය නියමිත ආකෘති පත්‍රයේ විය යුතු ය.

(ආ) එහි නියමිත තොරතුරු ඇතුළත් විය යුතු ය.

(ඉ) ලේකම්තැන විසින් එය අත්සන් කොට තිබිය යුතු ය.

19. (1) අංක 18 දරණ වගන්තියේ අංක (3) (ආ) (1) දරණ ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන්නට ප්‍රථම විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීම සඳහා විශෙෂ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ, යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් සම්බන්ධයෙන් පහත දක්වෙන විධිවිධාන අදාළ වන්නේය— විවාහ දැන්වීම සහතික නිකුත් කිරීම සඳහා විශෙෂ බලපත්‍ර

(අ) අංක 16 දරණ වගන්තියේ අංක (1) දරණ ඡේදය හෝ අංක (3) දරණ ඡේදය හෝ අංක (4) දරණ ඡේදය හෝ යටතේ යම් කොඨාසයක කොඨාස ලේකම් කෙනෙකු වෙත විවාහ දැන්වීමක් භාරකරවා ඇති අවස්ථාවකදී, එම කාලසීමාව ඉකුත් වන්නට පෙර, විවාහ දැන්වීම් සහතිකය නිකුත් කරන්නට එබඳු කොඨාස ලේකම් කෙනෙකුට බලය දෙන විශෙෂ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා එම කොඨාසය පිහිටා තිබෙණ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැනගෙන් ඉල්ලීමක් කිරීමට යථෝක්ත විවාහය හා සම්බන්ධවූ පක්ෂයකට පිළිවන.

(ආ) එබඳු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු කල්හි, මින්මතු දක්වෙන විධිවිධානවලට යටත්ව, දිස්ත්‍රික් ලේකම් තැන විසින් බලපත්‍රය නිකුත් කළ යුතු ය.

(ඉ) පහත සඳහන් අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්තැන විසින් බලපත්‍රය නිකුත් නො කළ යුතුය—

(i) විවාහ දැන්වීම් සහතිකය නිකුත්කිරීමට විරුඬවූ කිසියම් නීත්‍යනුකූල අවහිරයක් හෝ සෙසු කිසියම් නීත්‍යනුකූල බාධකයක් හෝ තමාට පෙන්වා තිබීම, නැතහොත්

(ii) විවාහ දැන්වීම් සහතිකය නිකුත් කිරීමට විරුඬව මෙම ආඥා පනත යටතේ විරුඬතාවක් දක්වන ලදුව, එම විරුඬතාව යටපත් කෙරෙන නියෝගයක් අංක 21 දරණ වගන්තිය යටතේ කර නො තිබීම ද වේ.

(ඊ) කොඨාස ලේකම්තැන වෙත භාර කරවන ලද දැන්වීමක සහතික පිටපතක් ඉදිරිපත් කළහොත් මිස, දිස්ත්‍රික් ලේකම්තැන විසින් බල පත්‍රය නිකුත් නො කළ යුතු ය.

(උ) ඒ පිළිබඳව අපේක්ෂකයා විසින් මෙම වගන්තියේ අංක (3) දරණ උප වගන්තියෙන් අවශ්‍ය වන ප්‍රකාශය කොට අත්සන් තැබුවහොත් මිස දිස්ත්‍රික් ලේකම්තැන විසින් බල පත්‍රය නිකුත් නො කළ යුතු ය.

(2) අංක 18 දරණ වගන්තියේ අංක (4) (ආ) (ii) දරණ ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන්නට ප්‍රථම විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීම සඳහා විශේෂ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ, යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය—

(අ) අංක 16 දරණ වගන්තියේ අංක (2) දරණ ඡේදය යටතේ කොඨාස ලේකම්වරුන් දෙදෙනෙකු වෙත විවාහ දැන්වීම් භාර කරවා ඇති අවස්ථාවකදී එම කාලසීමාව ඉකුත් වීමට පෙර සහතිකය නිකුත් කරන ලෙස එම කොඨාස ලේකම්වරුන් එක් එක් කෙනෙකුට බලය ලබා දෙන විශේෂ බලපත්‍රයක් සඳහා, යථෝක්ත කොඨාස ලේකම් වරුන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ කොඨාසය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැනගෙන් ඉල්ලීමක් කිරීමට විවාහය හා සම්බන්ධවූ පක්ෂයකට පිළිවන.

(ආ) එබඳු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු කල්හි මින්මතු දැක්වෙන විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් ලේකම් තැන විසින් බලපත්‍රය නිකුත් කළ යුතු ය.

(ඉ) පහත සඳහන් අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම් තැන විසින් බලපත්‍රය නිකුත් නො කළ යුතු ය—

(i) එම සහතිකවලින් එකක් මුත් නිකුත් කිරීමට විරුඬවූ කිසියම් නීත්‍යනුකූල අවහිරයක් හෝ සෙසු කිසියම් නීත්‍යනුකූල බාධකයන් තමාට පෙන්වා තිබීම, නැතහොත්

(ii) එම සහතික වලින් එකක් මුත් නිකුත් කිරීමට විරුඬව මෙම ආඥා පනත යටතේ විරුඬතාවක් දක්වන ලදුව එම විරුඬතාව යටපත් කෙරෙන නියෝගයක් අංක 21 දරණ වගන්තිය යටතේ කර නො තිබීම ද වේ.

(ඊ) එබඳු එක් එක් කොඨාස ලේකම්තැන වෙත භාර කරවන ලද දැන්වීම්වල සහතික පිටපත බැගින් ඉදිරිපත් කළ

හොත් මිස, දිස්ත්‍රික් ලේකම්තැන විසින් බල පත්‍රයක් නිකුත් නො කළ යුතු ය.

(උ) ඒ පිළිබඳව අපේක්ෂකයා විසින් මෙම වගන්තියේ අංක(3) දරණ උප වගන්තියෙන් අවශ්‍ය වන ප්‍රකාශය කොට අත්සන් තැබුවහොත් මිස දිස්ත්‍රික් ලේකම්තැන විසින් බලපත්‍රය නිකුත් නො කළ යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් විශේෂ බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම, ඒ පිළිබඳ අපේක්ෂකයා විසින්, ලේකම් ඉදිරියේ තමා ම පෙනී සිට, පහත සඳහන් කරුණු ඇතුළත් ප්‍රකාශයක් කොට, අත්සන් තැබිය යුතු ය—

(අ) විවාහය සම්බන්ධයෙන් නීත්‍යනුකූල අවහිරයක් හෝ සෙසු නීත්‍යනුකූල බාධකයක් නැති බව,

(ආ) විවාහය සඳහා මෙම ආඥා පනත යටතේ කිසියම් පුද්ගල යකුගෙ කැමැත්ත අවශ්‍ය බව හා එම කැමැත්ත ලබා ගෙන ඇති බව, නැතහොත් විවාහය සඳහා මෙම ආඥා පනත යටතේ කිසිම පුද්ගලයකුගේ කැමැත්ත අවශ්‍ය නො වන බව, සහ

(ඉ) සහතිකය නිකුත් කිරීමට විරුඬව මෙම ආඥා පනත යටතේ කිසිම විරුඬතාවක් දක්වී නැති බව හෝ එසේ දක්වන ලද විරුඬතාවක් වී නම් එය අංක 21 දරණ වගන්තිය යටතේ කරන ලද නියෝගයකින් යටපත් කරන ලද බව ද වේ.

ප්‍රකාශය කරන පක්ෂය විසින් සැපයිය යුතු නියමිත වටිනා කමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර එම ප්‍රකාශයට අමුණා තිබිය යුතු ය.

20. (1) විවාහයක් පිළිබඳ විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුඬව, ලියවිල්ලක මාර්ගයෙන් විරුඬත්වය දක්වීමට පහත සඳහන් අන්දමේ කවර කෙනෙකුට හෝ පිළිවන— විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීමට විරුඬව දක්විය හැකි විරුඬතා.

(අ) මෙම ආඥා පනත යටතේ උඩරට විවාහයක් සඳහා යම් පුද්ගලයකුගේ කැමැත්ත අවශ්‍ය ද, එබඳු හැම පුද්ගලය යෙක් ; නැතහොත්

(ආ) එබඳු විවාහයක් සම්බන්ධයෙන් සැලකිලිවන්තවූ පුද්ගල යෙක්ද වේ.

(2) සහතිකයක් නිකුත් කිරීමට විරුඬව දක්වන හැම විරුඬතා වක්ම—

(අ) මෙම ආඥාපනත යටතේ සහතිකය නිකුත් කිරීමට බලය දරණ ලේකම්තැන වෙත ඉදිරිපත් කළ යුතුය,

(ආ) එසේ ම එය නියමිත ආකෘති පත්‍රයට සාරානුකූලව පිළි යෙළ විය යුතු ය,

(ඉ) එහි පහත සඳහන් කරුණු ප්‍රකාශ කළ යුතු ය—

(i) විරුඬතාව දක්වන්නාගේ නම සහ ලිපිනය,

(ii) විරුඬතාව දක්වන්නා එසේ කරන්නේ මෙම ආඥා පනත යටතේ එම විවාහය සඳහා සවකීය කැමැත්ත අවශ්‍ය වන්නාවූ පුද්ගලයකු හැටියට ද නැතහොත් එම විවාහය සම්බන්ධව සැලකිලි වන්තවූ පුද්ගලයකු හැටියට ද යන බව, සහ

(iii) විරුඬතාව දක්වීමේ හේතුව හෝ හේතු ද වේ.

(ඊ) එය එබඳු ලේකම් කෙනෙකු ඉදිරියේදී විරුඬතාව දක්වන්නා හා ඔහු දන්නා විශ්වාසදායක සාක්ෂි කරුවන් දෙදෙනෙකු ද විසින් අත්සන් කළ යුතු ය.

**විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීමට විරුඬව දක්වන විරුඬතා පිළිබඳව විභාග පැවැත්වීම.**

21. (1) විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුඬව විරුඬතාවක් ලැබුණු විට, එය ලැබූ ලේකම් තැන, ඉදින් කොඨාස ලේකම් කෙනෙකු නම්, ඔහුගේ කොඨාසය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන වෙත එබඳු විරුඬතාව වහා ම යැවිය යුතු ය.

(2) යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් සම්බන්ධයෙන් විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුඬව, යටකී වගන්තිය යටතේ හෝ මෙම වගන්තිය යටතේ හෝ දිස්ත්‍රික් ලේකම් කෙනකු වෙත විරුඬතාවක් කරනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වහා ම, විවාහය පිළිබඳ එක් එක් පක්ෂයටත් විරුඬතාව දක්වන්නාටත් දිස්ත්‍රික් ලේකම්තැන විසින් නිවේදන භාර කරවිය යුතු ය.

(3) එම දැන්වීමෙන්—

(අ) සහතිකය නිකුත් කිරීමට විරුඬව දක්වෙන විරුඬතාවයේ ස්වභාවය ප්‍රකාශ කළ යුතු ය.

(ආ) එම විරුඬතාව ඇසීම සඳහා යථොක්ත අන්දමේ විස්තර වී ඇති දිනයක, විස්තර වී ඇති වේලාවක දිස්ත්‍රික් ලේකම් තැන ස්වකීය කාර්‍යාලයට හෝ එම දැන්වීමේ විස්තර කළ හැකි වෙනත් ස්ථානයකට හෝ පැමිණෙන බව දැන්විය යුතු යි, තවද

(ඉ) දැන්වීම යවනු ලැබූ පුද්ගලයාට සාක්ෂිකාරයන් ඇතොත් ඔවුනුත් සමග දැන්වීමේ දක්වූ දිනයේ එම වේලාවට එම ස්ථානයේදී දිස්ත්‍රික් ලේකම්තැන ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටි ා යුතු ය.

(4) දිස්ත්‍රික් ලේකම් තැන එම දැන්වීමේ සඳහන්වූ දිනයේ ඒ වේලාවට එම ස්ථානයට පැමිණ, එම දිනයේදීම හෝ විභාගය ඇසීමට හෝ වැඩි දුරට ඇසීමට කල් තැබිය හැකි වෙනත් දිනයකදී හෝ ලුහුඬු විභාගයක් පවත්වා එයින් පසුව, විරුඬතාව භාර ගනිමින් හෝ යටපත් කරමින් ආඥාවක් කළ යුතුය.

(5) එම විභාගය හා සම්බන්ධවූ එක් එක් පක්ෂයකට එම ආඥාවේ සහතික පිටපත බැගින් භාර කරවන්නට දිස්ත්‍රික් ලේකම්තැන විසින් සැලැස්විය යුතු ය. ඉදින් එම විරුඬතාව තමා වෙත ඉදිරිපත් කරන ලද්දේ, මෙම ආඥා පනතේ කොඨාස ලේකම් කෙනෙකු විසින් නම් ඔහුටත් එයින් පිටපතක් භාර කරවන්නට සැලැස්විය යුතු ය.

(6) විරුඬතාව සම්බන්ධයෙන් ක්‍රියා කර නිම වන්නට ප්‍රථම, විරුඬතාව ඉදිරිපත් කළ තැනැත්තාටත්, විවාහය හා සම්බන්ධවූ එක් එක් පක්ෂයටත්, ඉදින් ඔවුන්ට සාක්ෂිකාරයන් ඇතොත් එම සාක්ෂිකාරයන්ටත් තම තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දිස්ත්‍රික් ලේකම්තැන විසින් සලස්වා දිය යුතු ය.

(7) විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුඬව ඉදිරිපත් කරන ලද විරුඬතාවක් සම්බන්ධයෙන් ක්‍රියා කර නිම කිරීමේ කාර්‍යය සඳහා, මෙම වගන්තිය යටතේ තමා විසින් පවත්වන ලද විභාගයේ විස්තර වාර්තා ඇතුළත් ලේඛනයක් දිස්ත්‍රික් ලේකම්තැන විසින් තබා ගත යුතු ය.

උඩරට විවාහ සිදුකිරීම

22. (1) යෝජනාකර තිබෙණ උඩරට විවාහයක් සම්බන්ධයෙන් මෙම ආඥා පනත යටතේ දැන්වීමක් භාර කරවනු ලැබූ ලේකම් කෙනෙක්, ඉදින් එම විවාහය පිළිබඳවූ නීත්‍යනුකූල අවහිරයක් හෝ නීත්‍යනුකූල සෙසු බාධකයක් හෝ නැත්නම්, විවාහය පිළිබඳ පක්ෂ විසින් පහත සඳහන් ලියවිල්ල හෝ ලියවිලි හෝ අවස්ථානුකූලව ඉදිරිපත් කිරීමෙන් පසුව, මෙහි පහත පෙන්වා තිබෙණ පරිදි විවාහය සිදු කළ යුතු ය—

(අ) විවාහයක් සම්බන්ධයෙන් අංක 16 දරණ වගන්තියේ අංක (1) දරණ ඡේදයේ හෝ අංක (3) දරණ ඡේදයේ හෝ අංක (4) දරණ ඡේදයේ හෝ විධිවිධාන අදාළ වන අවස්ථාවක දී, එබඳු ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකයක් ඉදිරිපත් කළ විට ය.

(ආ) එබඳු ලේකම් කෙනෙකු දිස්ත්‍රික් ලේකම් කෙනෙකු වූ අවස්ථාවකදී, ඉදින්, විවාහය හා සම්බන්ධවන පක්ෂ දෙකම අංක 16 දරණ වගන්තියේ අංක (2) දරණ ඡේදයේ සඳහන් කාලසීමාවක් සවකීය දිස්ත්‍රික්කයේ පිහිටි වෙනම කොඨාසවල වාසය කර ඇති කල්හි, ඔහු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකයක් ඉදිරි පත් කළ විට ය.

(ඉ) එබඳු ලේකම් කෙනෙකු දිස්ත්‍රික් ලේකම් කෙනෙකු වූ අවස්ථාවකදී, ඉදින්, විවාහය සම්බන්ධවූ පක්ෂ දෙක ම අංක 16 දරණ වගන්තියේ අංක (2) දරණ ඡේදයේ සඳහන් කාල සීමාවක්, (එක් කොඨාසයක් සවකීය දිස්ත්‍රික්කය තුළ නො පිහිටි) වෙන් වෙන් කොඨාසවල වාසය කර ඇති කල්හි, පහත සඳහන් විවාහ දැන්වීම් සහතික, එනම්, එබඳු ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහත්කය සහ විවාහය පිළිබඳ දැන්වීමක් එම ඡේදය යටතේ භාර කරවන ලද වෙන යම් ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකය ද ඉදිරිපත් කළ විට ය.

(ඊ) ලේකම් තැන කොඨාස ලේකම් කෙනෙකු වූ අවස්ථාවකදී අංක 16 දරණ වගන්තියේ අංක (2) දරණ ඡේදය විවාහයක් සම්බන්ධයෙන් අදාළ වන කල්හි, පහත සඳහන් විවාහ දැන්වීම් සහතික, එනම්, එබඳු ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකය සහ විවාහය පිළිබඳ දැන්වීමක් එම ඡේදය යටතේ භාර කරවන ලද වෙන යම් ලේකම් කෙනෙකු විසින් නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකය ද ඉදිරිපත් කළ විට ය.

(2) ලේකම් තැන විසින්—

(අ) විවාහය හා සම්බන්ධ වන පක්ෂ දෙක හා සාක්ෂි කරුවන් දෙදෙනෙකු ඉදිරිපිටදී ;

(ආ) බලය දෙන ලද කිසියම් ස්ථානයක ;

(ඉ) කවර දිනයක නමුදු, බලය දෙන ලද කාලසීමා ඇතුළත කවර හෝ වේලාවක ;

(ඊ) මෙම වගන්තියේ අංක (3) දරණ උපවගන්තියේ විධිවිධාන වලට එකඟව ;

විවාහය සිදු කළ යුතු ය.

(3) එබඳු විවාහයක් පහත සඳහන් පරිදි සිදු කළ යුතු ය—

(අ) එබඳු විවාහය හා සම්බන්ධ වන පුරුෂ පක්ෂයට ස්ත්‍රී පක්ෂයේ අත ගැනීමට සලස්වා "මේ ස්ත්‍රිය (ඇගේ සම්පූර්ණ නාමය සඳහන් කළ යුතු යි) ඔබගේ විවාහක භාර්යාව වශයෙන් ගන්නට ඔබ කැමති ද?" යන්න ලේකම් තැන විසින් ඔහුගෙන් ඇසිය යුතු ය.

(ආ) එම පුරුෂ පක්ෂය පූර්වෝක්ත ප්‍රශ්නයට "එසේ යැයි උත්තර දුන් පසු, එබඳු විවාහය හා සම්බන්ධ වන ස්ත්‍රී පක්ෂයට, පුරුෂ පක්ෂයේ අත ගැනීමට සලස්වා "මේ පුරුෂයා (ඔහුගේ සම්පූර්ණ නාමය සඳහන් කළ යුතුයි) ඔබගේ විවාහක පුරුෂයා වශයෙන් ගන්නට ඔබ කැමති ද?" යන්න ලේකම්තැන විසින් ඇගෙන් ඇසිය යුතු ය,

(ඉ) ස්ත්‍රී පක්ෂය විසින් එම ප්‍රශ්නයට එසේ යැයි උත්තර දීමෙන් පසුව විවාහය සිදු කළ යුතු ය.

උඩරට විවාහ ලියාපදිංචි කිරීම

23. (1) පසුගිය වගන්තිය යටතේ ලේකම් කෙනෙකු විසින් උඩ රට විවාහයක් සිදු කරනු ලැබූ වහා ම, ලේකම් තැන විසින් පහත දක්වෙන විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු ය—

(අ) විවාහය පිළිබඳ පහත සඳහන් තොරතුරු ලේකම්තැන විසින් සවකීය විවාහ ලේඛන පොතෙහි නිවැරදි ලෙස සටහන් කළ යුතු ය—

(i) විවාහ වූ එක් එක් පක්ෂයේ සම්පූර්ණ නම, වයස, සිවිල් තත්වය (අවිවාහක ද, කණවැන්දුම් ද නැතහොත් දික්කසාද වී ද යන බව) රක්ෂාව හෝ වෘත්තිය සහ පදිංචි ස්ථානය ;

(ii) විවාහයේ ස්වභාවය (බින්න විවාහයක් ද, දීග විවාහයක් ද යන බව) ලේකම්තැන විසින් විවාහය ලියා පදිංචි කරන්නට පෙර දෙපක්ෂයෙන් අසා එය දැන ගත යුතු ය ;

(iii) විවාහය පිළිබඳ එක් එක් සාක්ෂිකරුවකු ගේ සම්පූර්ණ නම, රක්ෂාව හෝ වෘත්තිය හා පදිංචි ස්ථානය ද වේ.

(ආ) මෙම වගන්තියේ ඉහත දක්වූ විධිවිධාන යටතේ සවකීය විවාහ ලේඛන පොතේ සටහන් කළ තොරතුරු ඇතුළත් විවාහ ලියා පදිංචි කිරීමේ සටහනට (මෙයින් පසු මීට විවාහ ලියා පදිංචි කිරීමේ සටහන යැයි කියනු ලැබේ) එම විවාහයට ඇතුළත්වූ දෙපක්ෂයේද සාක්ෂිකාරයන්ගේද අත්සන් තබන්නට ලේකම්තැන විසින් සැලැස්විය යුතු ය,

(ඉ) විවාහය පිළිබඳ දෙපක්ෂය හා සාක්ෂිකරුවන් විසින් විවාහ ලියා පදිංචි කිරීමේ සටහනට අත්සන් තැබූ ඉක්බිති, එම විවාහය සම්බන්ධයෙන් මෙම ආඥා පනත යටතේ නිකුත් කරන ලද විවාහ දැන්වීම් සහතිකයේ හෝ අවස්ථානුකූලව සහතිකවල හෝ ඇතුළත් වී ඇති තොරතුරු, එම විවාහය සම්බන්ධයෙන් විවාහ ලියා පදිංචි කිරීමේ සටහනෙහි ලේඛනගත කළ තොරතුරු හා ගැළපෙන බව ඒත්තු ගැනීමෙන් පසුව ලේකම්තැන විසින් එම සටහනෙහි තමාගේ අත්සන ද තැබිය යුතු ය.

(ඊ) විවාහ ලියා පදිංචි කිරීමේ සටහනෝ තබන ලද කිසියම් පුද්ගලයකුගේ අත්සනක් නොපැහැදිලි යයි ලේකම් තැනට පෙනී ගියහොත් හෝ, එම සටහනේ අත්සන් කරනු වෙනුවට කිසියම් පුද්ගලයකු ස්වකීය මාපට ඇඟිලි සලකුණ තැබුවහොත්, එම අත්සනට හෝ එම මාපට ඇඟිලි සලකුණට හෝ උඩින් එම පුද්ගලයාගේ නම ලේකම්තැන විසින් ලිවිය යුතු ය.

(2) විවාහ ලියා පදිංචි කිරීමේ සටහන—

(අ) මුල පත්‍ර හා උප පත්‍ර ක්‍රමයට පිළියෙළ කළ යුතු ය. (මේ දෙක අතුරෙන් මුල පත්‍රය දෙවෙනි පිටපත යනුවෙන් ද උප පත්‍රය මුල් පිටපත යනුවෙන් ද මින් පසු සඳහන් කරනු ලැබේ).

(ආ) විවාහ ලියා පදිංචි කිරීමේ සටහන—

(i) විවාහය හා සම්බන්ධවූ පක්ෂ දෙක හා සාක්ෂිකාරයන් ඉදිරිපිට දී ;

(ii) බලය දෙන ලද කිසියම් ස්ථානයකදී ;

(iii) කවර දවසක නමුදු බලය දෙන ලද කිසියම් වේලාවකදී ;

කළ යුතු ය.

(3) විවාහය සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ කරන ලද විවාහ ලියා පදිංචි කිරීමේ සටහන, සෑම කාර්‍යයකදී ම, විවාහය ලියා පදිංචි කිරීම ලෙස සලකනු ලැබේ.

උඩරට විවාහ සිදු කිරීම හා ලියා පදිං. චි කිරීම බලය දෙනලද ස්ථානවලදී බලය දෙනලද වේලා අතරදී සිදුවූ ඒවා විමට, අවශ්‍යවූ කරුණු.

24. (1) මෙම ආඥා පනතේ කාර්‍ය සඳහා, උඩරට විවාහයක්, බලය දෙනු ලැබූ ස්ථානයක හා දවසේ බලය දෙනු ලැබූ කාලයකදී සිදුකරන ලද ලෙස හා ලියා පදිංචි කරනලද ලෙස පහත සඳහන් පරිදි සලකනු ලැබේ—

(අ) විවාහය සිදු කිරීම හා ලියා පදිංචි කිරීම කරන ලද්දේ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් නම්—

(i) ස්වකීය කාර්‍යාලයේදී යම් දිනයක පෙරවරු 6යේ සිට පස්වරු 6 දක්වා අතරතුර ඇති කවර හෝ වේලාවක ; නැතහොත්

(ii) විවාහය හා සම්බන්ධ වන පක්ෂයක් විසින් ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් කරන ලද ඉල්ලීමක් අනුව යථෝක්ත ලේකම්තැන විසින් ස්වකීය පරම අභිමතය පරිදි එසේ කිරීමට තීරණය කර ගන්නා ලද දිනයක, එබඳු අන් කිසි තැනකදී එබඳු කාල වේලාවක් අතරතුරදී ද ;

(ආ) විවාහය සිදුකිරීම හා ලියා පදිංචි කිරීම කරන ලද්දේ කොඨාස ලේකම් කෙනෙකු විසින් නම්—

(i) එම දිනයේ පෙරවරු 6යේ සිට පස්වරු 6 දක්වා වේලාවකදී ස්වකීය කාර්‍යාලයේ දී ; හෝ

(ii) විවාහය හා සම්බන්ධවන පක්ෂයක් විසින් ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් කරන ලද ඉල්ලීමක් අනුව, විවාහය පිළිබඳ දැන්වීම දෙනු ලැබූ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන විසින් කොඨාස

ලේකම්තැනට බලය දෙන ලද දිනයක, සෙසු එබඳු තැනකදී සෙසු එබඳු කාල වේලාවක් අතර තුරදී ද, වන්නේ ය.

(2) මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ ඉදිරිපත් කරන්නට බලය ඇති සෑම ඉල්ලුම් පත්‍රයකම නියමිත වටිනාකමින් යුත් මුද්දරයක් හෝ මුද්දර අලවා තිබිය යුතු ය.

**ලේකම්වරුන් විසින් කරනලද සටහන්වල දෙවැනි පිටපත් යැවීම.**

25. (1) සෑම කොඨාස ලේකම් කෙනෙක් ම, එක් එක් මාසයක් සම්බන්ධයෙන්—

(අ) එබඳු කොඨාස ලේකම්තැන විසින් එම මාසය තුළ ලියා පදිංචි කරන ලද සෑම විවාහයක ම දෙවෙනි පිටපත් ද,

(ආ) එම මාසය තුළ එබඳු ලියා පදිංචි කිරීමක් කර නැති නම්, ඒ බව ප්‍රකාශ වන සහතිකයක් ද,

රෙජිස්ත්‍රාර් ජනරාල් තැනගේ කාර්යාලයේ ආරක්‍ෂා කර තබනු සඳහා, ස්වකීය කොඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැනගේ මාර්ගයෙන් රෙජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත යැවිය යුතු ය.

එසේ වුව ද, රෙජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් ලේඛනයකින් නියම කරනු ලැබුවහොත් එම දෙවෙනි පිටපත හෝ සහතිකය කොඨාස ලේකම් කෙනෙකු විසින් රෙජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත කෙලින්ම යැවිය යුතු ය.

(2) සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙක් ම, එක් එක් මාසයක් සම්බන්ධයෙන්—

(අ) එබඳු දිස්ත්‍රික් ලේකම්තැන විසින් එම මාසය තුළ ලියා පදිංචි කරන ලද සෑම විවාහයක ම දෙවෙනි පිටපත් ද,

(ආ) එම මාසය තුළ එබඳු ලියා පදිංචි කිරීමක් කර නොමැති නම් ඒ බව ප්‍රකාශ කෙරෙන සහතිකයක් ද,

ඔහුගේ කාර්යාලයේ ආරක්‍ෂා කර තබනු සඳහා රෙජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත යැවිය යුතු ය.

(3) මෙම වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ තමා වෙත එවනු ලැබූ කිසියම් ලියවිල්ලක් ලැබුණු කල්හි, රෙජිස්ත්‍රාර් ජනරාල් තැන ඒවා ස්වකීය කාර්යාලයේ සුරක්‍ෂිත ලෙස තැන්පත් කර තබන්නට සැලැස් විය යුතු ය.

**විවාහ ලියාපදිංචි කිරීමේ සටහනේ මුල් පිටපත හෝ දෙවෙනි පිටපත වෙනුවට ඇතැම් අවස්ථාවලදී වෙනත් පිටපත් තැබීම.**

26. (1) මෙම ආඥාපනත යටතේ ලියා පදිංචි කරන ලද විවාහයක් පිළිබඳ ලියා පදිංචි කිරීමේ සටහනක මුල් පිටපතක් නැති වූ විටක හෝ විනාශවූ විටක හෝ කියවන්නට නොහැකි තත්ත්වයකට පත්වූ විටක හෝ කියවිය නොහැකි තත්ත්වයකට පැමිණිය හැකිව තිබෙණ විටක හෝ එහි දෙවෙනි පිටපත තිබේ නම්, සුදුසු විභාගයකින් පසු, දෙවෙනි පිටපත පරීක්‍ෂා කර බලා සාදන ලද බවටත්, දෙවෙනි පිට පතේ සැබෑ පිටපතක් බවටත් තමා විසින් සහතික කරනු ලැබූ දෙවෙනි පිටපතේ පිටපතක් ඒ වෙනුවට යොදවන්නට රෙජිස්ත්‍රාර් ජනරාල් තැනට පිළිවන.

(2) මෙම ආඥාපනත යටතේ ලියා පදිංචි කරන ලද විවාහයක් පිළිබඳ ලියා පදිංචි කිරීමේ සටහනක දෙවෙනි පිටපතක් නැති වූ විටක හෝ විනාශවූ විටක හෝ කියවන්නට නොහැකි තත්ත්වයට පත්වූ විටක හෝ කියවිය නොහැකි තත්ත්වයකට පැමිණිය හැකිව තිබෙණ විටක හෝ එහි මුල් පිටපත ලේකම් කෙනෙකු ළඟ

තිබේ නම්, සුදුසු විභාගයකින් පසුව, මුල් පිටපත පරීක්‍ෂා කර බලා සාදන ලද බවටත් මුල් පිටපතේ සැබෑ පිටපතක් බවටත් තමා විසින් සහතික කරනු ලැබ, ඉදින් යථෝක්ත ලේකම් තැන කොට්ඨාස ලේකම් කෙනෙකු නම් එකී කොට්ඨාස ලේකම් තැනගේ කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන විසින් ද අත්සන් කරනු ලැබූ මුල් පිටපතේ පිටපතක් ඒ වෙනුවට යොදන්නට රෙජිස්ත්‍රාර් ජනරාල් තැනට පිළිවන.

උඩරට විවාහ සිදු කිරීම හා ලියා පදිංචි කිරීම ප්‍රමාදවීමෙ ප්‍රතිඵල.

27. (1) යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් සිදු කරනු නො ලැබ හා ලියා පදිංචි කරනු නො ලැබ—

(අ) මෙම ආඥා පනත යටතේ යම් විවාහයක් පිළිබඳව ලේකම් කෙනෙකු විසින් විවාහ දැන්වීම් සටහනක් කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් ; හෝ

(ආ) මෙම ආඥා පනත යටතේ යම් විවාහයක් පිළිබඳ විවාහ දැන්වීම් සටහන ලේකම්වරුන් දෙදෙනෙකු විසින් කරන ලද අවස්ථාවකදී නම්, එම විවාහ දැන්වීම් සටහන් දෙක අතුරින් මුලින් කළ සටහන කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් හෝ ඉකුත් වන්නට ඉඩ හැරිය හොත්,

ඒ පිළිබඳ වූ දැන්වීම හෝ දැන්වීම් ද, සටහන හෝ සටහන් ද ඒ පිළිබඳ වූ හැම සහතිකයක්, බලපත්‍රයක් හා ඒ සම්බන්ධයෙන් දෙන ලද හෝ නිකුත් කරන ලද සෙසු හැම ලේඛනයක් ද, මෙම ආඥා පනතේ කාර්ය සඳහා අවලංගු වන්නේය. එසේ ම ක්‍රියා විරහිත වන්නේ ය.

(2) විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුඩව මෙම ආඥා පනත යටතේ දක්වන ලද විරුඩතාවක් සම්බන්ධයෙන් ක්‍රියා කර නිමවීම සඳහා ගන්නා ලද කාලය, මෙම වගන්තියේ අංක (1) දරන උප වගන්තියේ හෝ අංක 18 දරණ වගන්තියේ හෝ සඳහන් මාස තුනේ කාල සීමාව ගණන් ගැනීමෙහිදී ගණන් ගනු නො ලැබේ.

විවාහය පිළිබඳ හොඳම සාක්‍ෂිය විවාහය ලියා පදිංචි කිරීම බව.

28. (1) සියලුම උසාවි ඉදිරියේත්, විවාහය සම්බන්ධයෙන් සාක්‍ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය විය හැකි සැම නඩු විභාගයකදීත් උඩරට විවාහයක් සම්බන්ධයෙන් ඇත්තාවූ හොඳම සාක්‍ෂිය වූ කලී, මෙම ආඥාපනත යටතේ උඩරට විවාහයක් ලියා පදිංචි කරනු ලැබීම ය. 23 (3) දරණ වගන්තිය යටතේ විවාහයක් ලියා පදිංචි කළ බැව් පෙන්වන විවාහ ලියා පදිංචි කිරීමේ සටහනක එම විවාහය බින්න විවාහයක් ද, දීග විවාහයක් ද යන්න දක්වා නැති අවස්ථාවකදී, එය එසේ නො වන බව ඔප්පු කරන තුරු, එම විවාහය දීග විවාහයක් හැටියට සලකනු ලැබේ.

(2) මෙම වගන්තියේ අංක (1) දරණ උප වගන්තියේ කාර්ය සම්බන්ධයෙන්—

(අ) ලේකම් කෙනෙකු විසින් ඔහුගේ විවාහ ලේඛන පොතෙහි ඇතුළත් කරන ලද මුල් පිටපත වෙනුවට අංක 26 දරණ වගන්තියේ අංක (1) දරණ උප වගන්තිය යටතේ යොදන ලද පිටපත ; හා

(ආ) ලේකම් කෙනෙකු විසින් ඔහුගේ විවාහ ලේඛනයේ ඇතුළත් කරන ලද දෙවෙනි පිටපත වෙනුවට අංක 26 දරණ වගන්තියේ අංක (2) දරණ උප වගන්තිය යටතේ යොදන ලද පිටපතත් ;

එබඳු ලේඛනයක එබඳු ලේකම් කෙනෙකු විසින් ඇතුළත් කරන ලද මුල් සටහනක් හැටියට සලකනු ලැබේ.

උඩරට විවාහයක් ලියාපදිංචි කිරීමෙන් පසු සමහර කරුණු ඔප්පු කිරීම අවශ්‍ය බව

29. උඩරට විවාහයක් සිදු කිරීමෙන් හා ලියා පදිංචි කිරීමෙන් පසු—

(1) එම විවාහය තහවුරු කරනු පිණිස පහත සඳහන් කරුණු ඔප්පු කිරීම අවශ්‍ය නො වන්නේ ය—

(අ) විවාහ දැන්වීමේ විස්තර වී තිබෙණ දිස්ත්‍රික්කයේ හෝ කොඨාසයේ, යම් විවාහයක් හා සම්බන්ධ වූ පක්ෂයක් ඇත්ත වශයෙන් ම පදිංචිව සිටි බව හෝ, එබඳු පක්ෂයක් එහි විස්තරවී ඇති කාල සීමාව ඇතුළත පදිංචිව සිටි බව ;

(ආ) මෙම ආඥා පනත යටතේ ඒ සම්බන්ධයෙන් යමෙකුගේ කැමැත්ත ලබාගත යුතුව තිබිණි නම් එය ලබාගත් බව ; සහ

(ඉ) කිසියම් දිනයක බලය දෙන ලද වේලාවක් අතරතුරදී බලය දෙන ලද ස්ථානයකදී විවාහය සිදුකොට ලියා පදිංචි කරන ලද බවත් ය.

එසේම,

(2) එබඳු විවාහයක වලංගු භාවය සම්බන්ධවූ කිසියම් නඩුවකදී හෝ නඩු විභාගයකදී පහත සඳහන් කරුණු ඔප්පු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු නො වේ—

(අ) විවාහ දැන්වීමේ විස්තර වී තිබෙන දිස්ත්‍රික්කයේ හෝ කොඨාසයේ යම් විවාහයක් හා සම්බන්ධවූ පක්ෂයක් ඇත්ත වශයෙන් ම පදිංචිව නො සිටි බව හෝ එබඳු පක්ෂයක් එහි විස්තර වී ඇති කාලසීමාව ඇතුළත එහි පදිංචි ව නො සිටි බව ;

(ආ) මෙම ආඥා පනත යටතේ ඒ සම්බන්ධයෙන් යමෙකුගේ කැමැත්ත ලබා ගත යුතුව තිබිණි නම් එය ලබා නොගත් බව ; සහ

(ඉ) කිසියම් දිනයක බලය දෙන ලද වේලාවක් අතරතුරදී බලය දෙන ලද ස්ථානයකදී විවාහය සිදු කොට ලියා පදිංචි නොකරන ලද බවත් ය.

උඩරට විවාහ ලියාපදිංචි කිරීමට නොහැකි වීම සහ ලියාපදිංචි කිරීමේදී සිදුවූ වැරදි සම්බන්ධයෙන් ප්‍රතිකාර් යොදන පිළිවෙළ

30 (1) උඩරට විවාහයක් ලියා පදිංචි නො කොට හෝ වැරදි ලෙස ලියා පදිංචි කොට ඇති කල්හි, එම විවාහය ලියා පදිංචි කරන ලෙස හෝ, නිවැරදි ලෙස ලියා පදිංචි කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තැනගෙන් ඉල්ලා සිටින්නට ඒ හා සම්බන්ධවූ පක්ෂයකට පිළිවන. එම පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් පෙත්සමකින් එබඳු ඉල්ලීමක් තහවුරු කළ යුතු ය.

(2) මෙම වගන්තියේ අංක (1) දරණ උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු කල්හි, එම අපේක්ෂකයා වෙතත් තමාට සුදුසු යයි වැටහෙන වෙනත් පුද්ගලයන් වෙතත්, දැන්වීමක් භාර කරවන්නට රෙජිස්ට්‍රාර් ජනරාල්තැන විසින් සැලැස්විය යුතු ය. එම දැන්වීමෙන්—

(අ) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා දැන්වීමේ විස්තර කර ඇති දිනයක එම වේලාවට රෙජිස්ට්‍රාර් ජනරාල්තැන සවකීය කාර්‍යාලයට හෝ දැන්වීමේ විස්තර කළ හැකි වෙනත් ස්ථානයකට හෝ පැමිණෙන බව ප්‍රකාශ විය යුතු ය ; එසේ ම,

(ආ) එම දිනයේ එම වේලාවට, එසේ දන්වන ලද ස්ථානයේදී තමා ඉදිරියේ පෙනී සිටිය යුතු බව එම දැන්වීම ලබන තැනැත්තාට නියම කළ යුතු ය.

තවද, (අ) ඡේදයේ දක්වී ඇති තොරතුරු විස්තර කෙරෙන්නා වූද, එම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් සැලකිලිමත්වූ අයට, ඉදින් ඔවුන් කැමති නම්, දැන්වීමේ සඳහන්වී ඇති දිනයේ එම වේලාවට එම ස්ථානයේදී තමා ඉදිරියේ පෙනී සිටිය හැකි බව ප්‍රකාශ වන්නා වූ ද, දැන්වීමක් සවකීය කාර්‍යාලයේ පහසුවෙන් පෙනෙන ස්ථානයක ප්‍රසිද්ධ කරවන්නට රෙජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් සැලැස්විය යුතු ය.

(3) රෙජිස්ත්‍රාර් ජනරාල්තැන දැන්වීමේ සඳහන්වූ දිනයේ එම වේලාවට එම ස්ථානයට පැමිණ, ඔහුට අවශ්‍ය යයි වැටහෙන අන්දමේ ප්‍රසිද්ධ විභාගයක් පවත්වා, එම දිනයේ දී ම හෝ විභාග කිරීමට නැතහොත් වැඩිදුර විභාග කිරීමට කල් තැබිය හැකි වෙනත් දිනයකදී යථොක්ත ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාකර නිම කළ යුතු ය.

(4) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාකර අවසාන වන්නට ප්‍රථම, එම ඉල්ලුම් පත්‍රය පිළිබඳ දැන්වීම් යවා තිබෙණ පුද්ගලයන්ටත්, ඉදින් සාක්ෂිකාරයන් සිටිතොත් එම සාක්ෂිකාරයන්ටත්, අංක (2) දරන උප වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉදිරිපත්වන පුද්ගලයන්ටත් තමතමන්ගේ අදහස් දක්වීමට ඉඩ ප්‍රස්ථාවක් රෙජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් සලස්වා දිය යුතු ය.

(5) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර අවසාන කිරීමේදී, එයට ඉඩ දෙමින් හෝ එය ප්‍රතික්ෂෙප කරමින් හෝ රෙජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් නියෝගයක් කළ යුතු ය. එබඳු නියෝගයකින්—

(i) ඉදින් ඉල්ලුම් පත්‍රය විවාහයක් ලියා පදිංචි කිරීම සඳහා නම්, එම කොට්ඨාසය පිළිබඳ කොට්ඨාස ලේකම්තැන විසින් හෝ, වියයුතු පරිද්දෙන්, එම දිස්ත්‍රික්කය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් විසින් හෝ එම විවාහය ලියාං පදිංචි කළ යුතු බව ද;

(ii) ඉදින් ඉල්ලුම් පත්‍රය විවාහයක් නිවැරදි ලෙස ලියා පදිංචි කිරීම සඳහා නම්, එම කොට්ඨාසය පිළිබඳ කොට්ඨාස ලේකම් විසින් හෝ, වියයුතු අන්දමින්, එම දිස්ත්‍රික්කය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් විසින් එම විවාහය නිවැරදි ලෙස ලියා පදිංචි කළ යුතු බව ද;

නියම කළ යුතු ය.

(6) විවාහය අනික් කරුණු අතින් යථා පරිදි සිදු කර ඇතැයි ද, එය ලෙඛනයේ ලියා පදිංචි නොවූයේ හෝ වැරදි ලෙස ලියා පදිංචි වූයේ එම විවාහය හා සම්බන්ධවූ පක්ෂ දෙකෙන් එක් පක්ෂයකවත් කිසිම ක්‍රියාවක්, වරදක් හෝ නොසැලකිල්ලක් නිසා නො වේ යයි ද රෙජිස්ත්‍රාර් ජනරාල් තැනට ඒත්තු නොගියහොත්, උඩරට විවාහයක් ලියා පදිංචි කිරීම සඳහා හෝ නිවැරදි ලෙස ලියා පදිංචි කිරීම සඳහා හෝ කරනු ලබන කිසිම ඉල්ලීමකට රෙජිස්ත්‍රාර් ජනරාල් තැන මෙම වගන්තිය යටතේ ඉඩ දෙනු නො ලැබේ.

(7) සෑම ලේකම් කෙනෙක් ම මෙම වගන්තිය යටතේ රෙජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරනු ලබන කවර නියෝගයක් වුවද ඉෂ්ට කළ යුතු ය.

(8) මෙම වගන්තිය යටතේ කිසියම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියා කර අවසාන කිරීමේ කටයුතු සඳහා පවත්වනු ලබන සියලුම විභාග පිළිබඳ වාර්තා ලෙඛනයක් රෙජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් තබා ගත යුතු ය.

(9) මෙම වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවලින් රෙජිස්ට්‍රාර් ජනරාල් තැන වෙත පැවරී ඇති බලතල ඒ සම්බන්ධයෙන් සාමාන්‍ය වශයෙන් හෝ විශෙෂ වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් බලය දෙන ලද කවර දිස්ත්‍රික් ලේකම් කෙනෙකු කෙරෙහි ද පැවරෙන්නේ ය.

කොට්ඨාස වෙනස් කිරීමක් සිදුවූ විටක, උඩරට විවාහ පිළිබඳ විවාහ දැන්වීම් සහතික නිකුත් කිරීම් සහ විවාහ සිදුකිරීම හා ලියාප.දිංචි කිරීම.

31 (1) අංක 40 දරණ වගන්තිය යටතේ කරන ලද නියෝගයක හේතුවෙන්, එම නියෝගයේ විස්තර කර තිබෙණ දිනයක සිට, (මෙසින් පසු "පැරණි කොට්ඨාසය" යනුවෙන් හඳුන්වනු ලබන) කිසියම් කොට්ඨාසයක් ඇතුළත පිහිටි කිසියම් ප්‍රදේශයක් වෙනස් ම කොට්ඨාශයක් බවට හෝ (මෙසින් පසු "අලුත් කොට්ඨාශය" යනුවෙන් හඳුන්වනු ලබන) දනට තිබෙණ වෙනයම් කොට්ඨාසයක කොටසක් බවට හෝ පත්වූ විට, එසේම, එම ප්‍රදේශයේ පදිංචි පක්ෂයක් විසින් යෝජනාකර තිබෙණ උඩරට විවාහයක් පිළිබඳ දැන්වීමක්, එම දිනයට කලින් දී තිබුණු නමුත් අංක 18 දරණ වගන්තිය යටතේ නිකුත් කළ යුතු විවාහ දැන්වීම් සහතිකය එම දිනයට කලින් නිකුත් කර නැති හෝ, එම දිනයට කලින් විවාහය සිදුකර හෝ ලියා පදිංචි කර නැති අවස්ථාවකදී, මෙම ආඥා පනතේ කුමක් තිබුණු නමුදු, ඒ කාර්‍ය්‍ය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් හෝ එම ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගේ දිස්ත්‍රික්කයක නම් එම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන විසින් හෝ නම් කරන ලද පැරණි කොට්ඨාසයේ හෝ අලුත් කොට්ඨාසයේ ලේකම් කෙනකුට යථෝක්ත සහතිකය නිකුත් කරන්නට හෝ එම විවාහය සිදු කරන්නට හා ලියා පදිංචි කරන්නට ද, ඒ සම්බන්ධයෙන් මෙම ආඥා පනත යටතේ ලේකම් කෙනෙකු විසින් කළ යුතු වන්නාවූ සෙසු කවර කාර්‍ය්‍යයක් වුව ද කරන්නට ද පිළිවන. එසේම ඒ සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ විධිවිධාන යථා පරිදි අදාළ වන්නේ ය. එසේ නම් කරනු ලබන සෑම ලේකම් කෙනෙක් ම, රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් හෝ, දිස්ත්‍රික් ලේකම්තැන විසින් ඔහුට දිය හැකි උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

(2) එක් කොට්ඨාසයක් අලුත් කොට්ඨාසයක් වන පරිද්දෙන් වෙනත් කොට්ඨාසයක් හා සංයෝජනය කරන ලද කල්හි, අංක (1) දරන උප වගන්තියේ විධිවිධාන, ඉදින් කොට්ඨාසයක් ඇතුළත පිහිටි ප්‍රදේශයක් අමුතු කොට්ඨාසයක් වූ විට හෝ දනට ම තිබෙණ සෙසු කවර කොට්ඨාසයක හෝ කොටසක් වූ විට හෝ එම විධිවිධාන අදාළ වන්නේ යම් සේ ද, එපරිද්දෙන් ම අදාළ වන්නේ ය.

## IV වෙනි කාණ්ඩය

### දික්කසාද

දික්කසාදවීමට අවශ්‍ය කරුණු.

32. පහත දැක්වෙන කවර කරුණක් උඩ නමුත් උඩරට විවාහයක් අවලංගු කිරීමට ඉඩ දෙනු ලැබේ—

(අ) විවාහයෙන් පසු භාර්‍ය්‍යාව අනාචාරයේ හැසිරීම;

(ආ) පුරුෂයා අනාචාරයේ හැසිරීම; ඒ සමගම ඔහුගේ ව්‍යභිචාරය නැතහොත් අති කෲරතාව ද තිබිය යුතු ය;

(ඉ) භාර්‍ය්‍යාව විසින් අවුරුදු දෙකක් නො කඩවා සම්පූර්ණ ලෙස පුරුෂයා අත්හැර දැමීම;

(ඊ) පුරුෂයා විසින් අවුරුදු දෙකක් නො කඩවා සම්පූර්ණ ලෙස භාර්‍ය්‍යාව අත් හැර දැමීම;

(උ) දෙදෙනාටම ප්‍රීතිමත් ලෙස එක්ව ජීවත් වන්නට නො හැකි වීම ; අවුරුද්දක කාලසීමාවක් සංවාසයෙන් හා නිවෙසින් ආහාර ගැනීමෙන් තොර වී සිටීම මේ පිළිබඳ පරීක්ෂණය වන්නේය ;

(ඌ) දෙපක්ෂයේ කැමැත්ත.

දික්කසාද

33 (1) උඩරට විවාහයකට අයත් පුරුෂ පක්ෂයට ඉහතකී වගන්තියේ (අ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ හෝ (උ) ඡේදයේ විස්තර වී ඇති හේතු උඩ සවකීය විවාහය අවලංගු කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය. එසේම, ස්ත්‍රී පක්ෂයට, යටකී වගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඊ) ඡේදයේ හෝ (උ) ඡේදයේ විස්තර වී ඇති හේතු උඩ සවකීය විවාහය අවලංගු කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය. එබඳු ඉල්ලුම් පත්‍රයක්, ඉල්ලුම්කාර පක්ෂය පදිංචිව සිටිනා දිස්ත්‍රික්කය භාර දිස්ත්‍රික් ලේකම් තැන වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) උඩරට විවාහයක් හා සම්බන්ධවූ දෙපක්ෂය ම එකතුව, එම පක්ෂ දෙකෙන් කවර පක්ෂයක් හෝ පදිංචිව සිටින දිස්ත්‍රික්කය භාර දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගෙන් යටකී වගන්තියේ (ඌ) ඡේදය යටතේ සඳහන් හේතුවක් උඩ සිය විවාහය අවලංගු කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(3) ලිපියකින් කළයුතු මෙම ඉල්ලීමේ පහත සඳහන් පරිදි විය යුතු ය—

(අ) විවාහය හා සම්බන්ධවූ එක් එක් පක්ෂයේ සම්පූර්ණ නම් හා පදිංචිය සඳහන් කළ යුතු ය ;

(ආ) විවාහයේ සවභාවය (බින්න විවාහයක් ද, දීග විවාහයක්ද යන බව) සහ ජීවත්ව සිටින දරුවන්ගේ ගණන සඳහන් කළ යුතු ය ;

(ඉ) ඉල්ලීම කරනු ලබන්නේ කවර හේතුවක් හෝ හේතු උඩ ද යන බව සඳහන් කළ යුතු ය ;

(ඊ) එසේම, ඉල්ලුම් පත්‍රය ඉල්ලුම්කරු විසිනුත්, ඉදින් දෙපක්ෂයම එකතුව කරන ඉල්ලීමක් නම් දෙපක්ෂය ම විසිනුත් අත්සන් කළ යුතු ය.

(4) ඉල්ලුම් පත්‍රය ලැබුණු වහාම දිස්ත්‍රික් ලේකම් තැන විසින් එම විවාහය හා සම්බන්ධවූ දෙපක්ෂය වෙත දැන්වීමක් භාර කරවිය යුතු ය. එම දැන්වීමේ—

(අ) ඉල්ලීම කරනු ලබන්නේ කවර හේතුවක් හෝ හේතු උඩ ද යන බව සඳහන් විය යුතු ය ;

(ආ) එම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාකර අවසාන කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම්තැන යථෝක්ත දැන්වීමේ විස්තර වී ඇති දිනයක හා වේලාවක සවකීය කායර්‍යාලයට හෝ එම දැන්වීමේ විස්තර කළ හැකි වෙනත් සථානයකට හෝ පැමිණෙන බව ප්‍රකාශ විය යුතු ය ;

(ඉ) එසේ නියම කරන ලද දිනයේදී එම වේලාවට එම සථානයේදී යථෝක්ත දැන්වීම ලබන තැනැත්තා, ඉදින් සාක්ෂිකාරයන් සිටිතොත් ඔවුන්ද සමග, දිස්ත්‍රික් ලේකම්තැන ඉදිරියේ පෙනී සිටිය යුතු බව නියම කළ යුතු ය.

(5) දැන්වීමේ සඳහන්වූ දිනයේ එම වේලාවට එහි සඳහන්වූ සථානයට පැමිණ, තමාට අවශ්‍යයයි වැටහෙන අන්දමින් ලුහුඩු

විභාගයක් පවත්වා, එම දිනයේදී ම හෝ විභාග කිරීමට වැඩිදුරට විභාග කිරීමට කල් තැබිය හැකි වෙනත් දිනයක දී යථොක්ත ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්තැන ක්‍රියාකර අවසාන කළ යුතු ය.

(6) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කර අවසාන කිරීමේදී සිය අභිමතය පරිදි, පහත සඳහන් අන්දමේ නියෝගයක් දිස්ත්‍රික් ලේකම් තැන විසින් කළ යුතු ය—

(අ) විවාහ අවලංගු කිරීම සඳහා කර තිබෙණ ඉල්ලීමට ඉඩදීම ; නැතහොත්

(ආ) එබඳු විවාහයක් අවලංගු කිරීම සඳහා කර තිබෙණ ඉල්ලීම ප්‍රතික්ෂෙප කිරීම ද වේ.

(7) මෙම වගන්තිය යටතේ උඩරට විවාහයක් අවලංගු කිරීමට නියෝගයක් කිරීමේදී—

(i) එම විවාහය හා සම්බන්ධ වූ එක් පක්ෂයකට හෝ පක්ෂ දෙකට ම හෝ විවාහය අවලංගු කිරීමේ හේතුවෙන් කිසියම් වන්දියක් ගෙවීමට යථොක්ත දෙපක්ෂය අතරේ එකඟත්වයක් ඇතිව තිබේ නම්, එම පක්ෂවල ඉල්ලීම පරිදි යථොක්ත ගිවිසුමේ කොන්දේසි දිස්ත්‍රික් ලේකම් තැන විසින් සවකීය නියෝගයට ඇතුළත් කළ යුතු ය.

(ii) සවකීය භාය‍ර්‍යාවගේ නඩත්තුව සඳහා කලින් කල කිසියම් මුදලක් පුරුෂයා විසින් භාය‍ර්‍යාවට ගෙවීමට හෝ ඒ සඳහා වෙනත් විධිවිධානයක් යෙදීමට සිය අභිමතය පරිදි නියම කරන්නට දිස්ත්‍රික් ලේකම් තැනට පිළිවන. (එහෙත් මෙය කළ යුත්තේ අංක (1) දරණ ඡේදය යටතේ ඇයට වන්දි ගෙවීමේ කොන්දේසියක් එම නියෝගයට ඇතුළත් නොවූ විටක පමණක් ම ය).

(iii) සවකීය දරුවන්ගේ නඩත්තුව සඳහා කලින් කල යම්කිසි මුදලක් පුරුෂයා විසින් ගෙවිය යුතු බව හෝ ඒ සඳහා වෙනත් විධිවිධානයක් ඔහු විසින් යෙදිය යුතු බව හෝ සවකීය අභිමතය පරිදි සවකීය නියෝගයෙන් විධාන කිරීමට දිස්ත්‍රික් ලේකම් තැනට පිළිවන.

(8) මෙම වගන්තිය යටතේ කිසියම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධ යෙන් ක්‍රියා කර අවසාන කරන්නට ප්‍රථම, විවාහය හා සම්බන්ධ වූ එක් එක් පක්ෂයටත් ඉදිත් සාක්ෂිකාරයන් සිටිතොත් ඔහුගේ හෝ ඇයගේ සාක්ෂි කාරයන්ටත් තම තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට අවසථාවක් දිස්ත්‍රික් ලේකම් තැන විසින් සලසා දිය යුතු ය.

(9) සවකීය නියෝගයේ පිටපතක් විවාහය හා සම්බන්ධ වූ එක් එක් පක්ෂයකට ලැබෙන්නට දිස්ත්‍රික් ලේකම් තැන විසින් සැලැස් විය යුතු ය.

(10) උඩරට විවාහයක් මෙම වගන්තිය යටතේ අවලංගු කරමින් දිස්ත්‍රික් ලේකම්තැන විසින් කරන ලද හෝ, ගන්නා ලද ඇපැලකින් පසු දිස්ත්‍රික් උසාවියක් මගින් කරන ලද හෝ නියෝගයක්, අංක (11) දරණ උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, දිස්ත්‍රික් ලේකම්තැන විසින් සවකීය දික්කසාද ලේඛන පොතෙහි සටහන් කළ යුතු ය. යථොක්ත සටහන, එම විවාහය අවලංගු කිරීම පිළිබඳ ලියා පදිංචි කිරීම හැටියට සෑම කාය‍ර්‍යයකදී ම සලකනු ලබන අතර, එම සටහන කළ දිනය එබඳු ලියා පදිංචි කිරීමක් සිදු කළ දිනය හැටියටත්, එබඳු අවලංගු කිරීමක් සිදු කළ දිනය හැටියටත් සලකනු ලැබේ.

(11) උඩරට විවාහයක් අවලංගු කිරීමට ඉඩ දෙමින් දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් මෙම වගන්තිය යටතේ කරන ලද කිසිම නියෝගයක් පහත සඳහන් කාල සීමා ගතවන තෙක්, සවකීය දික්කසාද ලේඛන පොතෙහි ඇතුළත් නො කළ යුතු ය—

(අ) ඇපැල් ගැනීමක් සඳහා තිබෙණ කාල සීමාව ; සහ

(ආ) ඇපැලක් ඉදිරිපත් කර තිබෙණ කල්හි දිස්ත්‍රික් උසාවිය මගින් එම නියෝගය සථිර කරන තෙක් ද වේ.

දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් කරන ලද නියෝගයක්, යම් යම් වෙනස් කිරීම් හෝ සුළු වෙනස් කිරීම් සහිතව දිස්ත්‍රික් උසාවියක් විසින් සථිර කළ කල්හි, එසේ වෙනස් කරමින් කරන ලද ආඥාව දික්කසාද ලේඛන පොතෙහි ඇතුළත් කරනු ලැබේ.

(12) එබඳු ආඥාවක් මෙම උප වගන්තියේ විධිවිධානවලට එකඟව සවකීය දික්කසාද ලේඛන පොතෙහි ඇතුළත් කිරීම දිස්ත්‍රික් ලේකම් තැනගේ යුතුකම වන්නේ ය.

(13) උඩරට විවාහයක් අවලංගු කිරීම පිළිබඳව කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියා කර අවසාන කර ලීම අරභයා තමා විසින් මෙම වගන්තිය යටතේ පවත්වන ලද සියලු ම විභාගවල සටහන් පොතක් දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් තබා ගත යුතු ය.

34. (1) විවාහයක් අවලංගු කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් කරන ලද නියෝගයකින් අනාප්ත වූ කවර පක්ෂයකට වුව ද, මෙහි පහත විධිවිධාන යෙදී ඇති පරිද්දෙන්, එම නියෝගයට විරුඬව තමා පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවියට ඇපැල් ගන්නට පිළිවන. ඇපැල් ගැනීම.

(2) ලෙඛිත පෙත්සමක මාර්ගයෙන ඉදිරිපත් කළ යුතු මෙම ඇපැල, ඇපැල් ගන්නා පක්ෂය විසින සහතික කරන ලද දිවුරුම් පෙත්සමකුත් සමග, දිස්ත්‍රික් ලේකම්තැනගේ නියෝගය එබඳු ඇපැල් කාරයා වෙත භාර කරවා දින තිහක් ඇතුළත දී ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

(3) ඇපැල්කාරයා විසින් සැපයිය යුතු වූ, නියමිත වටිනා කමින් යුක්තවූ මුද්දරයක් හෝ මුද්දර ද යථොක්ත ඇපැල් පෙත්සමට අමුණා තිබිය යුතු ය.

(4) ඇපැල් පෙත්සම පහත සඳහන් පරිදි පිළියෙල විය යුතු ය—

(අ) එය නියමිත ආකෘති පත්‍රයේ විය යුතු ය ;

(ආ) ඇපැල්කාරයාගේ හා විවාහය හා සම්බන්ධවූ අනික් පක්ෂයේ නම් හා ලිපින එහි සඳහන් විය යුතු ය ;

(ඉ) ඇපැල ගනු ලබන්නේ කවර හේතුවක් හෝ හේතු උඩ ද යන බව එහි ප්‍රකාශ විය යුතු ය ;

(ඊ) නියම කළ හැකි වෙනත් තොරතුරු එහි ඇතුළත් විය යුතු ය ;

(උ) ඇපැල්කාරයා විසින් එහි අත්සන් තබා තිබිය යුතු ය.

(5) යම් දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගේ නියෝගයකට විරුඬව ඇපැලක් ඉදිරිපත් කරනු ලැබේ ද, එම දිස්ත්‍රික් ලේකම්තැන වෙත ඇපැල් පෙත්සම පළමුකොට ඉදිරිපත් කළ යුතු සි. එකී පෙත්සම ලැබුණු වහා ම, ඉහතකී වගන්තියේ විධිවිධාන යටතේ තමා විසින් තබා ගන්නා ලද සටහන් පොතත් සමග දිස්ත්‍රික් ලේකම්තැන විසින් එය දිස්ත්‍රික් උසාවියට වහාම යැවිය යුතු ය.

(6) මෙම වගන්තිය යටතේ ගන්නා ලද ඇපෑලකදී, දිස්ත්‍රික් උසාවියට පහත සඳහන් අන්දමේ ආඥාවක් කළ හැකි ය—

(අ) දිස්ත්‍රික් ලේකම්තැනගේ නියෝගය ස්ථිර කිරීම ;

(ආ) දිස්ත්‍රික් ලේකම්තැනගේ නියෝගය යම් යම් වෙනස් කිරීම් හෝ සුළු වෙනස් කිරීම් සහිතව ස්ථිර කිරීම ; නැතහොත්

(ඉ) එබඳු නියෝගයක් නිෂ්ප්‍රභ කිරීම, ඉදින් එම නියෝගය විවාහයක් අවලංගු කිරීම ප්‍රතික්ෂේප කෙරෙණ නියෝග යක් නම්, එම විවාහය අවලංගු කිරීම ද වේ.

6වෙනි පරිච්ඡේදය.

(7) ඒ සම්බන්ධයෙන් උසාවි ආඥා පනත යටතේ සම්පාදනය කර ගත හැකි නියෝගවලට යටත්ව, මෙම වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කර තිබෙණ ඇපෑලක් සම්බන්ධයෙන්, දිස්ත්‍රික් උසාවිය මගින් අනුගමනය කළ යුතු කාර්‍ය පරිපාටිය, උසාවිය විසින් නිර්ණය කර ගන්නා පරිදි විය යුත්තේ ය.

(8) මෙම වගන්තිය යටතේ උසාවිය මගින් කරන ලද ආඥාවක පිටපතක් දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන්නට, දිස්ත්‍රික් උසාවිය මගින් සැලැස්විය යුතු ය. එසේ ම එබඳු ආඥාවක් අනුව එම දිස්ත්‍රික් ලේකම් තැන කටයුතු කළ යුතු ය.

උඩරට විවාහ අවලංගු කිරීම පිළිබඳ ආඥා හා සම්බන්ධවූ විශේෂ විධිවිධාන.

35. (1) අංක (2) දරණ උපවගන්තියේ වෙනත් ක්‍රමයකට විශේෂ යෙන් විධිවිධාන යොදා නැති කල්හි, මෙම ආඥාපණත යටතේ උඩරට විවාහයක් අවලංගු කරන්නට දෙන ලද ආඥාවක්, ඉදින් එයින් අංක 33 දරණ වගන්තියේ අංක (7) දරණ උපවගන්තියේ (ii) ඡේදයේ හෝ (iii) ඡේදයේ විස්තර වී ඇති කරුණක් සඳහා විධිවිධාන යොදන කල්හි පමණක් ම, ක්‍රියාවේ යොදවන්නට, අවලංගු කරන්නට, වෙනස් කරන්නට හෝ නවත්වා ලන්නට ද, ඉදින් එම ආඥාව අවලංගු කරන ලද නම් හෝ නවත්වා ලන ලද නම්, අළුත් කරන්ට ද, එය සිවිල් නඩු විධාන සංග්‍රහයේ XLII වෙනි පරිච්ඡේදය යටතේ එම දිස්ත්‍රික් උසාවිය මගින් කරන ලද එබඳු ආඥාවක් හැටියට සලකා පිළිවන.

86වෙනි පරිච්ඡේදය.

(2) අංක 33 දරණ වගන්තියේ අංක (7) දරණ උපවගන්තියේ (ii) වෙනි ඡේදයෙ විස්තර වී ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් නායකීව පිළිබඳව එම ආඥාවෙන් විධිවිධාන යෙදෙන ප්‍රමාණයට පමණක්, විවාහය අවලංගු කළ දිනයේ පටන් කිසියම් පුරුෂයෙකු සමග ඇ සංවාසයේ යෙදෙමින් සිටි බව ඔප්පු කළහොත් විනා, මෙම ආඥාපණත යටතේ උඩරට විවාහයක් අවලංගු කරන්නට දෙන ලද නියෝගයක් අස් නො කළ හැක්කේ ය.

දික්කසාදයක් ලියාපදිංචි කිරීම ඒ පිළිබඳ හොඳ ම සාක්ෂිය බව.

36. උඩරට විවාහයක් අවලංගු කිරීම මෙම ආඥාපණත යටතේ ලියා පදිංචි කරනු ලැබීම, සියලු ම උසාවි ඉදිරියේත්, එබඳු අවලංගු කිරීමක් සම්බන්ධයෙන් සාක්ෂි දීම අවශ්‍ය විය හැකි සැම නඩු විභාගවලදීත්, එබඳු දික්කසාදයක් පිළිබඳව ඉදිරිපත් කළ හැකි හොඳ ම සාක්ෂිය වන්නේ ය.

## Vවෙනි කාණ්ඩය

### පරිපාලනය පිළිබඳ සංවිධාන

රෙජිස්ත්‍රාර් ජනරාල්.

37. (1) දිවයිනේ විවාහ පිළිබඳ රෙජිස්ත්‍රාර් ජනරාල් පදවිය නන් කාලයෙහි දරණ පුද්ගලයා මෙම මෙම ආඥාපණතේ කටයුතු සඳහා, උඩරට විවාහ පිළිබඳ රෙජිස්ත්‍රාර් ජනරාල් වන්නේ ය.

(2) මෙම ආඥාපනත යටතේ උඩරට විවාහ සිදු කිරීම සහ ලියාපදිංචි කිරීම ද, එම විවාහ අවලංගු කිරීම, ලියාපදිංචි කිරීම ද මෙම ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා පත් කරන ලද හෝ එම විධිවිධාන ක්‍රියාවේ යොදවමින් සිටින්නාවූ හෝ සියලු ම පුද්ගලයන් ද, රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් පරීක්ෂණය කරනු ලැබේ. එසේ ම පාලනය ද කරනු ලැබේ.

38. දිවයිනේ විවාහ පිළිබඳ උපරිජිස්ත්‍රාර් ජනරාල් පදවිය තන් කාලයෙහි දරණ සෑම පුද්ගලයෙක් ම මෙම ආඥාපනතේ කටයුතු සඳහා, උඩරට විවාහ පිළිබඳ උප රිජිස්ත්‍රාර් ජනරාල් වන්නේ ය. උප රිජිස්ත්‍රාර් ජනරාල්.

39. (1) උඩරට පළාත්වල කිසියම් කොටසක් යම්කිසි දිස්ත්‍රික්කයක සීමාව ඇතුළෙහි ඇති කල්හි, එබඳු එක් එක් දිස්ත්‍රික්කයක් සඳහා ම උඩරට විවාහ පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කෙනෙක් ඇති වන්නේ ය. දිස්ත්‍රික් ලේකම්වරු.

(2) අංක (1) දරණ උපවගන්තියේ සඳහන් වී ඇති කවර දිස්ත්‍රික්කයක වුව ද, පළාතක් භාර ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ කායඩ්ලයක් පිහිටා තිබේ නම්, එම දිසාපතිතැන, යථෝක්ත දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන වන්නේ ය. එසේම අංක (1) දරණ උපවගන්තියේ සඳහන් වී ඇති කවර දිස්ත්‍රික්කයක වුව ද, පළාතක් භාර ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ කායඩ්ලයක් පිහිටා නොමැති නම්, එම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපතිතැන එහි දිස්ත්‍රික් ලේකම්තැන වන්නේ ය.

. (3) අංක (1) දරණ උප වගන්තියේ සඳහන් වී ඇති කවර දිස්ත්‍රික්කයක වුව ද, පළාතක් භාර ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ කායඩ්ලයක් පිහිටා තිබේ නම්, එබඳු පළාතේ ආණ්ඩුවේ අතිරේක දිසාපතිතැනත්, ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ සෑම කායඩ්ලීය සහකාර නිලධාරියෙකුත් යථෝක්ත දිස්ත්‍රික්කය පිළිබඳ අතිරේක දිස්ත්‍රික් ලේකම් කෙනෙක් වන්නේ ය. එසේම අංක (1) දරණ උප වගන්තියේ සඳහන් දිස්ත්‍රික්කයක ආණ්ඩුවේ උප දිසාපතිතැනත්, සෑම ආණ්ඩුවේ අතිරේක උප දිසාපති කෙනෙකුත්, ආණ්ඩුවේ උප දිසාපති කෙනෙකුගේ සෑම කායඩ්ලීය සහකාර නිලධාරියෙකුත් යථෝක්ත දිස්ත්‍රික්කය පිළිබඳ අතිරේක දිස්ත්‍රික් ලේකම් කෙනෙක් වන්නේ ය.

(4) අංක (1) දරණ උප වගන්තියේ සඳහන් කවර දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් වුව ද, අංක (2) දරණ උප වගන්තියේ සඳහන් නිලධාරියා වෙනුවට, අන්කිසි පුද්ගලයකු දිස්ත්‍රික් ලේකම් වශයෙන් පත් කරනු ලැබිය හැකි ය. එසේ ම අංක (3) දරණ උප වගන්තියේ විස්තර වී ඇති නිලධාරියෙකු නො වන්නාවූ යම් පුද්ගලයකු, අතිරේක දිස්ත්‍රික් ලේකම් කෙනෙකු හැටියට පත් කරනු ලැබීමට ද පිළිවන.

(5) අංක 42 දරණ වගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙම ආඥාපනත යටතේ සවකීය දිස්ත්‍රික්කයේ උඩරට විවාහ සිදු කිරීම හා ලියාපදිංචි කිරීම ද, දික්කසාද ලියා පදිංචි කිරීම ද මෙම ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවේ යොදවනු සඳහා සවකීය දිස්ත්‍රික්කයෙහි පත්කොට ඇති හෝ එසේ ක්‍රියාවෙහි යෙදවීමෙහි යෙදී සිටින සියලුම පුද්ගලයන් ද පරීක්ෂා කිරීම හා පරිපාලනය කිරීම සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් කළ යුතු ය.

40. යම් දිස්ත්‍රික්කයක සීමා ඇතුළත උඩරට පළාතක කිසියම් කොටසක් ඇතුළත්ව තිබේ නම්, එබඳු එක් එක් දිස්ත්‍රික්කයක්, මෙම ආඥාපනතේ කායඩ් සඳහා, අවශ්‍ය යයි තමාට හැඟෙන උඩරට පළාත් කොට්ඨාසවලට බෙදීම.

පරිච්ඡේදෙන්, ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කිරීමෙන් කලින් කල කොට්ඨාශවලට බෙදන්නට අමාත්‍යවරයාට පිළිවන. එසේම කවර අවස්ථාවක වුව ද, එබඳු නියෝගයකින්, කිසියම් කොට්ඨාසයක් අවලංගු කරන්නට හෝ කිසියම් කොට්ඨාසයක සීමා වෙනස් කරන්නට ද අමාත්‍යවරයාට පිළිවන.

උඩරට විවාහ පිළිබඳ ලේකම් වරුන් පත්කිරීම.

41. (1) එක් එක් කොඨාසයකට, උඩරට විවාහ ලේකම් කෙනෙකු හැටියට වැඩ බැලීමට හෝ හැටියට හෝ විවාහ ලේකම් කෙනෙකු හැටියට වැඩ බැලීමට හෝ සුදුසු හා නිසිවූ පුද්ගලයෙකු හෝ දෙදෙනෙකු හෝ වැඩි ගණනක් බැගින් හෝ කලින් කල පත් කළ හැකි ය.

(2) කොට්ඨාසයක කොට්ඨාස ලේකම් කෙනෙකු මියගිය විටෙක හෝ හදිසියේ අසනීප වූ විටෙක හෝ අදක්ෂ බවක් දක්වූ විටෙක හෝ වෙනත් හදිසි අවස්ථාවක් පැමිණි විටෙක, ඔහු වෙනුවට වැඩ බැලීමට නිසි වූ සුදුසු පුද්ගලයෙකු, ස්වකීය අත්සන සහිත ලියවිල්ලකින් පත් කරන්නට රිජිස්ට්‍රාර් ජනරාල්තැනට හෝ එම කොට්ඨාශය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැනට පිළිවන. එසේ වුවද, එක් වතාවකදී දින තිහකට වැඩි වන්නා වූ කාලයක් සඳහා එබඳු පත් කිරීමක් දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් නො කළ යුතු ය.

(3) මෙම උප වගන්තියේ ඉහතදැක්වූ විධිවිධාන යටතේ රිජිස්ට්‍රාර් ජනරාල්තැන විසින් හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් හෝ කරන ලද, කොට්ඨාශ ලේකම් කෙනෙකුගේ සෑම පත් වීමක් ම ඒ සඳහා තමන් විසින් තබනු ලබන පොතක තමාගේ අත්සන සහිතව ඇතුලත් කළ යුතු ය.

නිලධාරීන්ගේ බලතල හා යුතුකම්.

42. (1) මෙම ආඥාපණත යටතේ හෝ මෙම ආඥාපණත මගින් පැනවී ඇති හෝ පැවරී ඇති බලතල, යුතුකම් හෝ කටයුතු ක්‍රියාවේ යෙදවීමේ දී, සිදු කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී—

(අ) එක් එක් උප රිජිස්ට්‍රාර් ජනරාල් කෙනෙක්, රිජිස්ට්‍රාර් ජනරාල් තැනගේ සාමාන්‍ය පරීක්ෂණයට හා පරිපාලනයට යටත් විය යුතු ය;

(ආ) එක් එක් දිස්ත්‍රික් ලේකම් කෙනෙක් රිජිස්ට්‍රාර් ජනරාල් තැනගේ සාමාන්‍ය පරීක්ෂණයට හා පරිපාලනයට යටත් විය යුතු ය.

(ඉ) එක් එක් කොට්ඨාශ ලේකම් කෙනෙක් ස්වකීය කොට්ඨාශය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැනගේ සාමාන්‍ය පරීක්ෂණයට හා පරිපාලනයට යටත් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන කවර නියමයකට ද, එසේ ම රිජිස්ට්‍රාර් ජනරාල් තැනගේ සාමාන්‍ය පරීක්ෂණයට හා පරිපාලනයට ද යටත්ව—

(අ) මෙම ආඥාපණත යටතේ හෝ මෙම ආඥාපණත මගින් රිජිස්ට්‍රාර් ජනරාල්තැන කෙරෙහි පැනවී ඇති හෝ පැවරී ඇති බලතල, යුතුකම් හෝ කටයුතු ක්‍රියාවේ යෙදවීමට, සිදු කිරීමට හෝ ඉටුකිරීමට එක් එක් උප රිජිස්ට්‍රාර් ජනරාල් කෙනෙකුට පිළිවන.

(ආ) මෙම ආඥාපණත යටතේ හෝ මෙම ආඥාපණත මගින් කොට්ඨාස ලේකම් කෙනෙකු කෙරෙහි පැනවී ඇති හෝ පැවරී ඇති බලතල, යුතුකම් හෝ කටයුතු, ක්‍රියාවේ යෙදවීමට, සිදු කිරීමට හෝ ඉටු කිරීමට එක් එක් දිස්ත්‍රික් ලේකම්තැනට පිළිවන.

43. (1) මෙහි ම මින්මතු වෙනත් ක්‍රමයකට විධිවිධාන යෙදී නැති කල්හි, සෑම කොට්ඨාස ලේකම් කෙනෙක් ම— කොට්ඨාස ලේකම්වරුන්ගේ නිවාසය, කාර්යාලය හා අතිරේක කාර්යාල.

(අ) ස්වකීය කොට්ඨාසය පිහිටා තිබෙන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන විසින් නියම කරන අන්දමේ ස්වකීය කොට්ඨාසය තුළ පිහිටි පහසු ස්ථානයක ස්වකීය කාර්යාලය පිහිටුවා ගත යුතු ය.

(ආ) දිස්ත්‍රික් ලේකම්තැන විසින් එසේ නියම කරනු ලැබුව හොත් ඔහු විසින් අනුමත කරනු ලබන ප්‍රමාණ අතිරේක කාර්යාල සංඛ්‍යාවක් ද සිය කොට්ඨාසයේ පිහිටුවා ගත යුතු ය.

එසේ වුවද, කිසියම් විශේෂ අවස්ථාවක්දී ස්වකීය දිස්ත්‍රික්කයේ පිහිටි කවර කොට්ඨාසයක කොට්ඨාස ලේකම් කෙනෙකුට වුවද, තම කොට්ඨාසයෙන් පිටත පිහිටි ස්ථානයක පදිංචි වන්නට හෝ කාර්යාලය පවත්වන්නට හෝ කිසියම් අතිරේක කාර්යාලයක් පිහිටුවා ගන්නට හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගෙන් කලින් ලබා ගන්නා ලද අනුමතියක් ඇතිව, බලය දෙන්නට දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට පිළිවන.

(2) ස්වකීය දිස්ත්‍රික්කයේ කොට්ඨාස ලේකම්වරුන්ගේ නිවාසය, කාර්යාලය සහ ඉදින් අතිරේක කාර්යාලයක් හෝ කාර්යාල ඇත්නම් ඒවා ද පිහිටුවා ගතයුතු හැටියට තමා විසින් නියම කරන ලද ස්ථාන, දිස්ත්‍රික් ලේකම්තැන විසින් වහා ම රෙජිස්ට්‍රාර් ජනරාල්තැන වෙත දැන්විය යුතු ය.

44. සෑම කොට්ඨාස ලේකම් කෙනෙක් ම— කොට්ඨාස ලේකම්වරුන් කාර්යාලයට පැමිණීම ආදිය

(අ) ස්වකීය කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන විසින් නියම කරනු ලබන දිනවලදී එසේ නියම කරනු ලබන වේලාවල පිළිවෙලින් ස්වකීය කාර්යාලයේ හෝ ඉදින් අතිරේක කාර්යාල ඇතොත් ඒවායේ පැමිණ සිටිය යුතු ය. එසේම,

(ආ) "උඩරට විවාහ ලේකම් තැන" යන වචන සහිත ස්වකීය නාමයත්, ස්වකීය කොට්ඨාශයේ නාමයත් දිස්ත්‍රික් ලේකම් තැන විසින් නියම කරන ලද පරිදි තමා කාර්යාලයට පැමිණෙන දින හා වේලාවලුත්, ඉංග්‍රීසි හා සිංහල යන භාෂා වලින් පැහැදිලි අකුරෙන් ලියා තමාගේ කාර්යාලයේ හා ඉදින් අතිරේක කාර්යාල තිබේ නම් ඒවායේ දොරටුව සමීපයේ පහසුවෙන් පෙනෙන ස්ථානයක තැබ විය යුතුය.

45. (1) සෑම ලේකම් කෙනෙක් ම පහත සඳහන් පොත් තබා ගත යුතු ය— ලේකම්වරුන් විසින් තැබිය යුතු පොත්.

(අ) නියමිත ආකෘතියට සාරානුකූල ලෙස පිළියෙල වූ "විවාහ දැන්වීම් ලේඛන පොත" නමින් පොතක් ද ;

(ආ) නියමිත ආකෘතියට සාරානුකූල ලෙස පිළියෙල වූ "විවාහ ලේඛන පොත" නමින් පොතක් ද ;

(ඉ) මෙම ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ විධිවිධාන මගින් තබා ගැනීමට අවශ්‍ය ලෙස නියම කරනු ලැබිය හැකි වෙනත් පොත් ද වේ.

(2) සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙක් ම, නියමිත ආකෘතියට සාරානුකූල ලෙස පිළියෙල වූ "දික්කසාද ලේඛන පොත" නමින් පොතක් තබා ගත යුතු ය.

(3) ලේකම් කෙනෙකු විසින් විවාහ දැන්වීම් ලේඛන පොතෙහි හෝ විවාහ ලේඛන පොතෙහි හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් දික්කසාද ලේඛන පොතෙහි හෝ ඇතුළත් කරන ලද සටහන් අනුක්‍රමයෙන් අංක කළ යුතු ය.

(4) මෙම ආඥාපනතේ කාර්ය සඳහා නියම කළ හැකි පොත්, නියම කළ හැකි ආකෘතියක් අනුව, රෙජිස්ට්‍රාර් ජනරාල්තැන හා එක් එක් දිස්ත්‍රික් ලේකම් විසින් තබා ගත යුතු ය.

(5) මෙම ආඥාපනත යටතේ හෝ මෙම ආඥාපනත මගින් වෙනත් ක්‍රමයකට විධිවිධාන යෙදී ඇතහොත් විනා, බලය ඇති උසාවියකින් කරනු ලබන නියෝගයකට කීකරු වීම් වශයෙන් හැර, මෙම ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් සහ එක් එක් ලේකම් කෙනෙකු විසින් තබා ගනු ලබන කිසිම පොතක් හෝ වෙනත් ලේඛනයක් තම තමන්ගේ ස්වාමිත්වයෙන් ඉවත් වන්නට ඉඩ නො දිය යුතු ය.

කොට්ඨාස ලේකම්වරුන්ගේ හා ඔවුන්ගේ කාර්යාල ආදිය පිළිබඳ නාම ලේඛන ප්‍රසිද්ධ කිරීම.

46. රෙජිස්ට්‍රාර් ජනරාල්තැන, දිවයිනේ සිටින්නාවූ කොට්ඨාස ලේකම්වරුන්ගේ නාම ලේඛනයක්, ඔවුන්ගේ නම් හා ඔවුන්ගේ කොට්ඨාසවල නම් ද, කාර්යාල හා ඉදින් අතිරේක කාර්යාල ඇත්නම් ඒවා පිහිටි ස්ථාන ද සහිතව ගැසට් පත්‍රයේ කලින් කල ප්‍රසිද්ධ කළ යුතු ය.

ව්‍යවස්ථා පැනවීමට ඇති බලය.

47. (1) මෙම ආඥාපනත මගින් නියම කළ යුතු සියලුම කරුණු සම්බන්ධයෙන් ද, සාමාන්‍ය වශයෙන් මෙම ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද, රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ, කොට්ඨාස ලේකම්වරුන්ගේ සහ මෙම ආඥාපනත යටතේ ස්වකීය රාජකාර්ය කරන කවර අන්දමේ නමුදු සෑම පුද්ගලයින්ගේත් උපදේශය පිණිස, කලින් කල ව්‍යවස්ථා සම්පාදනය කරන්නට අමාත්‍යවරයාට පිළිවන.

(2) මෙම වගන්තිය යටතේ සම්පාදනය වන කිසි ම ව්‍යවස්ථාවක්, උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත කරනු ලැබ එම අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන තෙක්, වලංගු නො වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද ව්‍යවස්ථාවක් උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත වූ බව ප්‍රකාශ කෙරෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වූ පසු, එය මෙහි ම පණවන ලද්දක් මෙන් වලංගුව ක්‍රියාත්මක වන්නේ ය.

## VI වෙනි කාණ්ඩය

### සාමාන්‍ය

පරීක්ෂාව සඳහා පොත් ආදිය ඉදිරිපත් කිරීම.

48. (1) කොට්ඨාස ලේකම් කෙනෙකු වශයෙන් තමාගේ ස්වාමිත්වයේ තිබෙන කවර පොතක් හෝ අන් කිසි ලේඛනයක් වුව ද, පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්තැන හෝ දිස්ත්‍රික් ලේකම් තැන විසින් ඉල්ලා සිටි කල්හි, එබඳු සෑම කොට්ඨාස ලේකම් කෙනෙක් ම එය, රෙජිස්ට්‍රාර් ජනරාල්තැන වෙත හෝ, විය යුතු පරිද්දෙන්, දිස්ත්‍රික් ලේකම්තැන වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මෙම ආඥාපණත යටතේ රිජිස්ත්‍රාර් ජනරාල්තැන හෝ ලේකම් කෙනෙකු හෝ විසින් තබා ගනු ලබන සෑම පොතක් ද, සෙසු ලේඛන ආදිය ද, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු කවර පුද්ගලයෙකුට මුත් පරීක්ෂා කර බැලීම සඳහා තැබිය යුතු ය.

*ලේඛන ආදියේ භාරකාරත්වය.*

49. (1) තමා විසින් ලියා සම්පූර්ණ කරන ලද සෑම ලේඛන පොතක් ම, සෑම කොට්ඨාස ලේකම් කෙනෙකු විසින් ම දිස්ත්‍රික් ලේකම්තැන වෙත එවිය යුතු ය.

(2) තම විසින් ලියා සම්පූර්ණ කරන ලද සෑම ලේඛන පොතක් ද, අංක (1) දරණ උප වගන්තිය යටතේ තමා වෙත එවනු ලබන සෑම ලේඛන පොතක් ද සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් ම ස්වකීය කාර්යාලයේ සුරකිව තබා ගත යුතු ය.

*ස්වකීය රාජ කාර්ය කාලය කෙළවරවීමේදී ලේකම්තැන ලේඛන ආදිය භාරදීම.*

50. කොට්ඨාසයක කොට්ඨාස ලේකම් කෙනෙකු හැටියට ස්වකීය රාජ කාර්යය කෙළවර කිරීමේදී, කොට්ඨාස ලේකම් හැටියට ස්වකීය ස්වාමිත්වය යටතේ තිබුණු සියලු ම පොත් ලේඛන හා වෙනත් ලියුම් ස්වකීය කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන වෙත හැකි තරම් ඉක්මණින් යැවිය යුතු ය. එසේ එවන ලද පොත්, ලේඛන හා වෙනත් ලියුම් දිස්ත්‍රික් ලේකම් තැන විසින් සුරකිව තබා ගත යුතුවාත් හැර, සේවයෙන් විශ්‍රාම ලත් එබඳු ලේකම් වෙනුවට අභිනව ලේකම් කෙනෙකු පත් වූ කල්හි, පූර්වෝක්ත සෑම පොතක්, ලේඛනයක් හා සෙසු ලියුමක් එම අභිනව ලේකම් තැන වෙත යැවිය යුතු ද වන්නේ ය.

*ලේඛනවල ලිපි දෝෂ ශුද්ධ කිරීම.*

51. මෙම ආඥා පනත යටතේ තබනු ලබන කිසියම් ලේඛනයක තිබී කලින් කල සම්භ විය හැකි යම් ලිපි දෝෂයක්, අවශ්‍ය යයි තමාට වැටහෙන අන්දමේ විභාගයකින් පසු ශුද්ධ කරන්නට රිජිස්ත්‍රාර් ජනරාල් තැනට හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද සෙසු කිසියම් පුද්ගලයෙකුට හෝ පිළිවන.

*ලේඛන නැති කර දැමීම.*

52. මෙම ආඥා පනතේ කුමක් තිබුණ ද, මෙම ආඥා පනත යටතේ තමා වෙත භාර කරවන ලද, ඉදිරිපත් කරන ලද හෝ එවන ලද කවර විවාහ දැන්වීම් ලේඛන පොතක්, සහතිකයක්, බලපත්‍රයක්, ඉල්ලුම් පත්‍රයක්, දැන්වීමක් හෝ ප්‍රකාශයක් වුව ද, යථෝක්ත ලේඛන පොතේ අන්තිම සටහන ඇතුලත් කිරීමෙන්, නැතහොත්, වියයුතු පරිද්දෙන්, යථෝක්ත සහතිකය, බලපත්‍රය, ඉල්ලුම් පත්‍රය, දැන්වීම හෝ ප්‍රකාශය පිළිබඳ දිනයෙන්, අවුරුදු දහයක් ඉකුත්වීමෙන් පසු, නැති කරවා දමන්නට දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට පිළිවන.

*විභාග සම්බන්ධයෙන් ඇත්තාවූ බලතල.*

53. (1) මෙම ආඥා පනත යටතේ, කිසියම් විභාගයක කටයුතු සඳහා පනත සඳහන් පරිදි ක්‍රියා කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල් තැනට හෝ යම්කිසි දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට හෝ පිළිවන—

(අ) යම් විභාගයක් සඳහා අවශ්‍ය යයි තමාට හැඟී යන යම් යම් ලේඛන හෝ ලියුම් තමා ඉදිරියේ තැබීමට ද, ඒවා, තබා ගෙන සිටින්නාවූ හෝ එබඳු ලේඛන හා ලියුම්වලට වග කිව යුත්තාවූ හෝ කවර පුද්ගලයකුට වුව ද එබඳු විභාගයකදී තමා ඉදිරියට පැමිණ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කොට අත්සන් කිරීමට ද ලිපියක මාර්ගයෙන් නියම කිරීම ;

(ආ) එබඳු විභාගයකදී දිවුරුම් පිට පරීක්ෂා කිරීමට තමා කැමති කවර පුද්ගලයෙකුට වුව ද ඒ සඳහා තමා ඉදිරිපිට පෙනී සිටින ලෙස ලිපියක මාර්ගයෙන් නියම කිරීම ;

(ඉ) (ආ) අක්ෂරය දරණ ඡේදයේ සඳහන් කවර පුද්ගලයකු වුව ද දිවුරවීම හෝ ඔහු ලවා සපිර ප්‍රකාශයක් කරවීම ද වේ.

(2) (අ) අංක (1) දරණ උපවගන්තිය යටතේ එසේ කරන ලෙස නියම කරනු ලැබූ කිසියම් පුද්ගලයකු යම් යම් ලේඛන හෝ ලියුම් ඉදිරිපත් කිරීමට නො සැලකිලිවන්ත වුවහොත් හෝ ඉදිරිපත් නො කළහොත් හෝ ප්‍රකාශයක් කරන්නට හෝ එබන්දක් අත්සන් කරන්නට නොසැලකිලිවන්ත වුවහොත් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කළහොත්, නැතහොත්,

(ආ) අංක (1) දරණ උපවගන්තිය යටතේ එසේ කරන්නට නියම කරනු ලැබූ කිසියම් පුද්ගලයකු එබඳු විභාගයකට පැමිණීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැමිණීම සම්බන්ධයෙන් නොසැලකිලිවන්ත වුවහොත්, නැතහොත් ;

(ඉ) මෙම ආඥා පනත යටතේ පවත්වනු ලබන විභාගයකදී බොරු සාක්ෂි දුන්නොත්,

ඔහු මෙම ආඥාපනත යටතේ වරදකට වරදකාරයා වන අතර නඩු විභාගයකින් වරදකාරයා වීමේදී රුපියල් සියයකට වැඩි නොවූ දඩයකට ද යටත් වන්නේ ය.

ගාස්තු.

54. (අ) සවකීය කායසීලයේදී හෝ බලය දෙන ලද වෙනත් සථානයකදී යෝජනා කර තිබෙණ උඩරට විවාහයක් සිදු කිරීම හා ලියා පදිංචි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට ගෙවි ා යුතුවූ ගාස්තුව වශයෙන්, හෝ

(ආ) සවකීය කායසීලයෙන් පිට බලය දෙන ලද කවර සථානයක දී මුත් එබඳු විවාහයක් සිදු කිරීම හා ලියා පදිංචි කිරීම සඳහා කොට්ඨාශ ලේකම් කෙනෙකුට ගෙවිය යුතුවූ ගාස්තුව වශයෙන් හෝ,

නියම කළ හැකි ගාස්තුව, එසේ එම විවාහය සිදු කරන ලෙස හා ලියා පදිංචි කරන ලෙස එබඳු ලේකම් කෙනෙකුගෙන් ඉල්ලා සිටින පුද්ගලයා විසින් කලින් ගෙවිය යුතු ය. එසේම මෙම ආඥා පනතේ කුමක් තිබුණා ද, එම ගාස්තුව කලින් නො ගෙවන ලද නම්, යථොක්ත විවාහය සිදු කිරීම හා ලියා පදිංචි කිරීම ප්‍රතික්ෂෙ කරන්නට එම ලේකම් තැනට පිළිවන.

## VIIවෙනි කාණ්ඩය

## විවිධ කරුණු

විශෙෂ කරුණු සකස් කර ගැනීම.

55. සාමාන්‍යයෙන් හෝ විශෙෂ කරුණක් නොහොත් කරුණු සම්බන්ධයෙන් ද උඩරට පළාත් සියල්ලෙහි ම නොහොත් ඉන් නියමිත කොටසක් ඇතුළත පමණක් ද, මෙම ආඥාපනත ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන ප්‍රාථමික කරුණු සම්බන්ධයෙන්, බලා පොරොත්තු නො වූ හෝ විශෙෂ අවසථා සඳහා කටයුතු සැලැස්වීම

පිණිස හෝ යම්කිසි කරුණක් හෝ ප්‍රශ්නයක් නිරණය කිරීම හෝ සකස් කිරීම සඳහා මෙම ආඥා පනතින් විධිවිධාන හෝ ප්‍රබල විධිවිධාන සලස්වා නැති විටක එබඳු කරුණු නිරණය කිරීම හෝ සකස් කිරීම පිණිස ද තමාට අවශ්‍ය ලෙස හැඟෙන අන්දමේ සියලු විධිවිධාන, ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කිරීමෙන් නිකුත් කිරීමට අමාත්‍යවරයාට පිළිවන.

56. (1) නියමිත ගාස්තුවක් සමග ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් එවූ විට, රිජිස්ත්‍රාර් ජනරාල් තැනගේ හෝ, විය යුතු පරිද්දෙන්, ලේකම් තැනගේ හෝ සවාමිත්වය යටතේ තිබෙණ පොතක හෝ වෙනත් ලෙඛනයක ඇතුළත් වූ සටහනක සහතික පිටපතක් හෝ එම සටහනෙන් උඩෘත කොටසක් රිජිස්ත්‍රාර් ජනරාල් තැනගෙන් හෝ කවර ලේකම් කෙනෙකුගෙන් හෝ ලබා ගත හැකි ය. පොත් ආදියෙහි සහතික පිටපත්.

(2) එබඳු පිටපතක් හෝ උඩෘත කොටසක් රිජිස්ත්‍රාර් ජනරාල් තැනගේ හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගේ අත්සනින් සාදනු ලැබ පෙන්වා සිටින ලෙස හෝ කොඨාශ ලේකම් කෙනෙකුගේ අත්සනින් සාදනු ලැබ එම කොඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් තැන සැබෑ බවට අත්සන් තබා තිබෙණ බැව් පෙන්වා සිටින විට, එම සටහන පිළිබඳව වැඩිදුරටත් සාක්ෂි ඔප්පු කිරීමක් නොමැතිව, එය ඒ හා සම්බන්ධ වූ කාරණය පිළිබඳව, බැලූ බැල්මට ම ඒත්තු යන සාක්ෂියක් හැටියට භාර ගනු ලැබේ.

57. (1) මෙම ආඥාපනතේ කටයුතු සම්බන්ධයෙන් යම්කිසි පුද්ගලයෙකු වෙත භාර කරවීම නිකුත් කරවීම ඉදිරිපත් කරවීම හෝ ලැබෙන්නට සැලැස්වීම අවශ්‍යවූ හෝ එසේ කරවීමට බලය දෙනු ලැබූ කවර දැන්වීමක්, සහතිකයක්, නියෝගයක්, ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් ලෙඛනයක් පහත සඳහන් ක්‍රමවලින් ඔහු වෙත භාර කර වන්නට, නිකුත් කරවන්නට, ඉදිරිපත් කරවන්නට හෝ ලැබෙන්නට සලස්වන්නට පිළිවන— දැන්වීම් ආදිය භාර කරවීම.

(අ) එය, එම පුද්ගලයා අතට දීමෙන් ;

(ආ) එය, එම පුද්ගලයා සිරිත් පරිදි පදිංචිව සිටින හෝ අන්තිමට පදිංචිව සිටි හෝ නිවාසයේ හෝ, ඉදින් එය භාරකරවිය යුත්තේ රිජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත හෝ ලේකම් කෙනෙකු වෙත නම් ඔහුගේ කායඛාලයේ දැමීමෙන් ; හෝ

(ඉ) එය, එම පුද්ගලයා සිරිත් පරිදි පදිංචිව සිටින හෝ අන්තිමට පදිංචිව සිටි නිවාසයට හෝ ඉදින් එය භාරකර විය යුත්තේ රිජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත හෝ ලේකම් කෙනෙකු වෙන නම් ඔහුගේ කායඛාලයට තැපැල් මගින් යැවීමෙන් ද වේ.

(2) මෙම ආඥාපනතේ කටයුතු සම්බන්ධයෙන් රිජිස්ත්‍රාර් ජනරාල් තැන වෙත හෝ ලේකම් කෙනෙකු වෙත භාර කරවීම, නිකුත් කරවීම, ඉදිරිපත් කරවීම හෝ ලැබෙන්ට සැලැස්වීම අවශ්‍ය වූ හෝ එසේ කරවීමට බලය දෙනු ලැබූ කවර දැන්වීමක්, සහතිකයක්, නියෝගයක්, ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් ලෙඛනයක්, රිජිස්ත්‍රාර් ජනරාල් තැනට හෝ ලේකම් තැනට භාරදුනහොත් හෝ රිජිස්ත්‍රාර් ජනරාල්

තැනගේ හෝ, විය යුතු පරිද්දෙන්, ලේකම් තැනගේ කාර්යාලයට රිජිස්ටර් තැපෑලෙන් යැවුවහොත් එය නිසි පරිදි භාර කරනු ලැබූ ලෙස, නිකුත්කරනු ලැබූ ලෙස, ඉදිරි පත් කරනු ලැබූ ලෙස නැතහොත් ලැබෙන්නට සලස්වනු ලැබූ ලෙස සලකනු ලැබේ.

(3) මෙම ආඥාපනතේ කටයුතු සම්බන්ධයෙන් රිජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් හෝ ලේකම් කෙනෙකු විසින් භාරකරවීම, නිකුත් කරවීම, ඉදිරිපත් කරවීම, හෝ ලැබෙන්නට සැලැස්වීම අවශ්‍යවූ හෝ එසේ කරවීමට බලය දෙනු ලැබූ කවර දැන්වීමක්, සහතිකයක්, නියෝගයක්, නැතහොත් අන්කිසි ලේඛනයක් වුවද, ඉංග්‍රීසි භාෂාවෙන් හෝ සිංහල භාෂාවෙන් විය යුතු ය.

වියදම්.

58. මෙම ආඥාපනත ක්‍රියාවේ යෙදවීමෙහිදී සිදුවන සියලුම වියදම්, ඒ සඳහා පාර්ලිමේන්තුවෙන් වෙන් කරනු ලබන මුදල්වලින් ගෙවනු ලැබේ.

ගාස්තු ගෙදවීම.

59. අංක 54 දරණ වගන්තිය යටතේ ගාස්තුවක් වශයෙන් කොට්ඨාස ලේකම් කෙනෙකුට ගෙවන ලද කිසියම් මුදලකින් බාහිරවූ, මෙම ආඥාපනත යටතේ, මුද්දර ගාස්තු, ගාස්තු හෝ දඩ වශයෙන් ගෙවන ලද හෝ අය කර ගන්නා ලද සියලු ම මුදල් ඒකාබද්ධ අරමුදලෙහි තැන්පත් කරනු ලැබේ.

## VIII වෙනි කාණ්ඩය

## වැරදි, දණ්ඩුවම් හා පදර්ථ

බොරු ප්‍රකාශ ආදිය.

60. යම් කෙනෙකු—

(අ) උඩරට විවාහයක් සිදු කරවා ගැනීම හෝ ලියා පදිංචි කරවා ගැනීම පිණිස දැන දැනම හෝ ඕනෑ කමින් බොරු ප්‍රකාශයක් කර එයට අත්සන් තැබූ විට හෝ මෙම ආඥාපනත යටතේ කිසියම් බොරු දැන්වීමක් අත්සන් කළ විටද, නැතහොත්,

(ආ) උඩරට විවාහයක් සම්බන්ධයෙන් විවාහ දැන්වීම් සහතිකයක් නිකුත් කිරීමට විරුද්ධව මෙම ආඥාපනත යටතේ විරුද්ධතාවක් දැක්වීම සඳහා, තමා මෙම ආඥාපනත යටතේ යථෝක්ත විවාහයට කැමැත්ත ලබාගත යුතු පුද්ගලයෙකු නොවී සිටිය දී, එසේ ඉදිරි පත්වීම සාවද්‍ය බව දැන දැනත් එසේ ඉදිරිපත් වන විට ද ;

හෙතෙම මෙම ආඥාපනත යටතේ වරදකට වරදකාරයා වන්නේ ය.

ලේඛන ආදිය නැතිකර දැමීම.

61. යම් කිසිවෙකු—

(අ) ~~අංක~~ 52 දරණ වගන්තියේ විධිවිධාන යෙදී ඇති ආකාරයෙන් පිටස්තරව, මෙම ආඥාපනත යටතේ තබා ගනු ලබන කිසියම් දැන්වීමක්, සහතිකයක්, ප්‍රකාශයක්, ලේඛන පොතක්, පොතක් හෝ වෙනත් ලේඛනයක් නැතහොත් ඉන් කොටසක් හෝ මෙම ආඥාපනත යටතේ තබාගනු ලබන එබඳු දැන්වීමක, සහතිකයක, ප්‍රකාශයක,

ලේඛන පොතක, පොතක හෝ ලේඛනයක සහතික පිට පතක් හෝ එබඳු සහතික පිටපතක කොටසක් හෝ දැන දැන ම හා ඕනෑකමින් ඉරුවහොත්, විකෘති හෝ විනාශ කළ හොත් ; හෝ

(ආ) දැන දැන ම හා ඕනෑකමින් එබඳු කිසියම් දැන්වීමක, සහතිකයක, ප්‍රකාශයක, ලේඛන පොතක, පොතක හෝ ලේඛනයක කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් කළ හොත් ; හෝ

(ඉ) මෙම ආඥාපනත යටතේ එබඳු කිසියම් දැන්වීමක්, ප්‍රකාශයක්, ලේඛන පොතක්, පොතක් හෝ ලේඛනයක් පිළිබඳව සාවද්‍ය සහතිකයක් අත්සන් කළහොත් හෝ නිකුත් කළහොත් ; හෝ

(ඊ) යම් ලියවිල්ලක්, කිසියම් එබඳු දැන්වීමක, සහතිකයක, ප්‍රකාශයක, ලේඛන පොතක, පොතක හෝ ලේඛනයක සැබෑ පිටපතක් හෝ එබන්දක උධෘත කොටසක් හෝ නොවන බව දැන දැනම, එය පිටපතක් හෝ, විය යුතු පරිද්දෙන්, උධෘත කොටසක් බව යම් පුද්ගලයෙකු සහතික කළහොත් ;

හෙතෙම මෙම ආඥාපනත යටතේ වරදකට වරදකාරයා වන්නේ ය.

62. යම් කිසිවෙකු—

(අ) උඩරට විවාහයක් සිදු කිරීමට මෙම ආඥාපනත යටතේ හෝ මෙම ආඥා පනත මගින් හෝ බලය ලැබී නැති බව දැන දැන ම හා ඕනෑකමින් ම එබඳු විවාහයක් සිදුකළහොත් හෝ ලියා පදිංචි කළහොත්, නැතහොත් — අනිසි විවාහ ආදිය සිදු කිරීම.

(ආ) විවාහයට සම්බන්ධවන එක් පක්ෂයක් හෝ, විය යුතු පරිද්දෙන්, දෙපක්ෂය ම එබඳු විවාහයකට පත්වීමට නීත්‍යනුකූලව නුසුදුසු බව දැන දැන ම හා ඕනෑ කමින් ම උඩරට විවාහයක් සිදු කළහොත්,

හෙතෙම මෙම ආඥාපනත යටතේ වරදකට වරදකාරයා වන්නේ ය.

63. යම් ලේකම් කෙනෙකු—

(අ) මෙම ආඥා පනතේ කිසියම් විධිවිධානයක් හෝ ඒ යටතේ සම්පාදිත කිසියම් ව්‍යවස්ථාවක් හෝ උල්ලංඝනය කරමින් ඒ බව දැන දැන ම හා ඕනෑ කමින් ම උඩරට විවාහයක් සිදු කළහොත් හෝ ලියා පදිංචි කළහොත්, නැතහොත් ; — ලේකම් වරුන්ගේ වැරදි.

(ආ) මෙම ආඥා පනතේ කිසියම් විධිවිධානයක් හෝ ඒ යටතේ සම්පාදිත කිසියම් ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරමින්, මෙම ආඥා පනත යටතේ කිසියම් සහතිකයක්, බලපත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් දැන දැන ම හා ඕනෑ කමින් ම නිකුත් කළ හොත් හෝ ප්‍රදානය කළ හොත් නැතහොත් ;

(ඉ) යම් පුද්ගලයෙකුට හෝ ආණ්ඩුවට හානියක් කිරීමේ අදහසින් හෝ එසේ හානියක් සිදුවිය හැකි බව දැන ගෙන

සිටිය දී, මෙම ආඥා පනතේ කිසියම් විධිවිධානයකට හෝ කිසියම් ව්‍යවස්ථාවකට හෝ ඒ යටතේ සම්පාදිත කිසියම් ව්‍යවස්ථාවකට දැන දැනම අකීකරු වුවහොත් ;

හෙතෙම මෙම ආඥාපනත යටතේ වරදකට වරදකාරයා වන්නේ ය.

**දඬුවම්.**

64. මෙම ආඥා පනත යටතේ කරනු ලබන සෑම වරදකටම, ඉදින් මෙයට විරුඬව එහි විශෙෂයෙන් විධිවිධාන යෙදී නැති කල්හි, රුපියල් දහසකට නො වැඩි දඩයකින් හෝ අවුරුදු දෙකකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමෙන් හෝ, එබඳු දඩයෙන් හා බන්ධනාගාරගත කිරීමෙන් යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කළ හැකි වන්නේ ය.

**මහේස්ත්‍රාත් උසාවියේ විභාග කළ හැකි වැරදි.**

65. මෙම ආඥාපනත යටතේ කෙරෙන සියලු ම වැරදි, අපරාධ නඩු විධාන සංග්‍රහයේ පළමු වෙනි උපලෙඛනයේ කුමක් තිබුණ ද, එම අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළවීම සඳහා මහේස්ත්‍රාත් කෙනෙකු විසින් විසඳිය හැකි වැරදි වන්නේ ය.

**පදාර්ථ.**

66. පද සම්බන්ධයෙන් වෙනත් අර්ථයක් නො යෙදෙන කල්හි, මෙම ආඥාපනතේ—

"අතිරේක දිස්ත්‍රික් ලේකම්" යනුවෙන් කිසියම් දිස්ත්‍රික්කයක උඩරට විවාහ පිළිබඳ අතිරේක දිස්ත්‍රික් ලේකම් පදවිය තත් කාලයේදී දරන පුද්ගලයෙක් අදහස් වේ.

"උපරිජිස්ත්‍රාර් ජනරාල්" යනුවෙන් මෙම ආඥාපනතේ කට යුතු විෂයෙහි ලා උඩරට විවාහ පිළිබඳ උප රිජිස්ත්‍රාර් ජනරාල් ධුරය තත් කාලයේදී දරන පුද්ගලයෙක් අදහස් වේ.

"දිස්ත්‍රික්කය" යනුවෙන් ආදායම් දිස්ත්‍රික්කයක් අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්" යනුවෙන් කවර දිස්ත්‍රික්කයක හෝ උඩරට විවාහ පිළිබඳ දිස්ත්‍රික් ලේකම් පදවිය දරන පුද්ගලයෙකු අදහස් වන අතර, අතිරේක දිස්ත්‍රික් ලේකම් කෙනෙක් ද ඊට ඇතුළත් වන්නේ ය.

"කොට්ඨාශය" යනුවෙන් මෙම ආඥාපනත යටතේ උඩරට පළාත් බෙදනු ලැබ තිබෙන කොට්ඨාශයක් අදහස් වේ.

"කොට්ඨාශ ලේකම්" යනුවෙන් කොට්ඨාශයක, උඩරට විවාහ පිළිබඳ විවාහ ලේකම් පදවිය තත් කාලයේදී දරන්නාවූ පුද්ගලයෙක් අදහස් වේ.

"උඩරට විවාහය" යනුවෙන් උඩරට නීතියට යටත් වූ පුද්ගල යන් අතර මෙම ආඥාපනත යටතේ සිදුවන විවාහයක් අදහස් වේ.

"උඩරට පළාත්" යනුවෙන් මෙම ආඥාපනතේ පෙනෙන උප ලේඛනයේ I වෙනි කොටසේ සඳහන් පළාත් අදහස් වන අතර එම උප ලේඛනයේ II වෙනි කොටසේ සඳහන් ප්‍රදේශ ද ඇතුළත් වන්නේ ය.

" විවාහය පිළිබඳ නීත්‍යානුකූල වයස " යනුවෙන්—

(අ) විවාහයක් හා සම්බන්ධ වන පුරුෂ පක්ෂයට නම්, දහසය හැවිරිදි වයස ද,

(ආ) විවාහයක් හා සම්බන්ධ වන ස්ත්‍රී පක්ෂයට නම්, දොළොස් හැවිරිදි වයස ද,

අදහස් වේ.

" අඩුවයස්කාරයා " යනුවෙන් වයස දහ අටෙන් අඩු වූ පුරුෂයෙක් ද, වයස දහසයෙන් අඩු වූ ස්ත්‍රියක් ද අදහස් වෙති.

"කාර්‍යාලය " යන්නෙහි, කොට්ඨාශ ලේකම් කෙනෙකු විෂයෙහි ලා සලකන කල්හි ඔහු විසින් මෙම ආඥාපනත යටතේ පිහිටු වන ලද කවර අතිරේක කාර්‍යාලයක් මුත් ඇතුළත් වන්නේ ය.

" නියමිත " යනුවෙන් මෙම ආඥාපනත යටතේ සම්පාදිත ව්‍යවස්ථා මගින් නියමිත වූ යන්න අදහස් වේ.

" ලේකම් " යනුවෙන් කවර දිස්ත්‍රික් හෝ කොට්ඨාශ ලේකම් කෙනෙක් වුව ද අදහස් වේ.

" රිජිස්ට්‍රාර් ජනරාල් " යනුවෙන් මෙම ආඥාපනතේ කටයුතු විෂයෙහි ලා උඩරට විවාහ පිළිබඳ රිජිස්ට්‍රාර් ජනරාල් පදවිය තත් කාලයේදී දරන්නාවූ පුද්ගලයා අදහස් වේ.

## IX වෙනි කාණ්ඩය

### අවලංගු කිරීම් හා තාවකාලික විධිවිධාන ආදිය

96 සහ 97වෙනි පරිච්ඡේද අවලංගු කිරීම.

**67.** උඩරට විවාහ ආඥාපනත හා උඩරට විවාහ පිළිබඳ (සැක හැරීමේ) ආඥාපනත මෙයින් අවලංගු කරන ලදී.

උඩරට විවාහ ආඥාපනත යටතේ තබන ලද ලේඛන පොත් ආදිය හා සම්පාදනය කරන ලද ව්‍යවස්ථා.

**68.** (1) මෙම ආඥා පනතේ අංක 67 දරන වගන්තියෙන් උඩරට විවාහ ආඥා පනත අවලංගු කරන ලද නමුදු, එම ආඥා පනත යටතේ තබන ලදුව නියමිත දිනයට ප්‍රථම දිනයෙහි තිබුණු සෑම ලේඛන පොතක් හෝ පොතක් ද මෙම ආඥා පනතේ ඒ හා ගැලපෙන විධිවිධාන යටතේ තබන ලද ලේඛන පොතක් හෝ, විය යුතු පරිද්දෙන්, පොතක් හැටියට සලකනු ලබන අතර, එම ලේඛන පොතෙහි හෝ සෙසු පොතෙහි කරන ලද සෑම සටහනක් ම මෙම ආඥා පනතේ ඒ හා සමාන විධිවිධාන යටතේ කරන ලද සටහන් ලෙස ද සලකනු ලැබේ.

එසේ වුවද, එම ආඥාපනත අවලංගු කර තිබෙන නමුත්, එබඳු කිසියම් ලේඛන පොතක කර ඇති කිසියම් සටහනක සත්‍යතාවය නිරණය කළ යුත්තේ යථෝක්ත ආඥාපනත අවලංගු කර නොතිබුණු කලෙක එය නිරණය කරන ආකාරයට ය.

(2) මෙම ආඥාපනතේ අංක 67 දරන වගන්තියෙන් උඩරට විවාහ ආඥාපනත අවලංගු කර ඇත්තත්, එම ආඥාපනත යටතේ සම්පාදනය කරන ලද නියමිත දිනයට ප්‍රථම දිනයේ වලංගුව තිබුණු කිසියම් ව්‍යවස්ථාවක්, මෙම ආඥාපනත යටතේ සම්පාදිත ව්‍යවස්ථාවක් හැටියට සලකනු ලබන අතර, එය යථා යෝග්‍ය පරිද්දෙන් මෙම ආඥාපනත යටතේ වෙනස් කරනු ලැබීමට හෝ සංශෝධනය කරනු ලැබීමට හෝ අවලංගු කරනු ලැබීමට පිළිවන.

ඇතැම් විවාහ සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන අදාළ වන බව.

69. උඩරට විවාහ ආඥාපනත සහ උඩරට විවාහ පිළිබඳ (සැක හැරීමේ) ආඥාපනතද අවලංගු කර ඇති නමුත්, උඩරට විවාහ ආඥාපනතේ විස්තර වී ඇති පරිද්දෙන් පහත සඳහන් විධිවිධාන විවාහ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය :—

(1) කිසියම් විවාහයක් පිළිබඳ දැන්වීම, නියමිත දිනයට ප්‍රථම, පූර්වෝක්ත උඩරට විවාහ ආඥාපනත යටතේ භාර කරන ලද නම්, එබඳු කවර විවාහයක් වුව ද ලියා පදිංචි කිරීම සඳහාත්, එසේ ලියා පදිංචි කරන ලද විවාහයක වලංගු භාවය පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් තීරණය කර ගැනීම සඳහාත්, යථෝක්ත උඩරට විවාහ ආඥාපනතේ විධිවිධාන තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(2) එබඳු කිසියම් විවාහයක් අවලංගු කරවා ගැනීම සඳහා යථෝක්ත ආඥාපනත යටතේ නියමිත දිනයට ප්‍රථම කර ඇති ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කර අවසාන කිරීමේ කටයුතු සඳහාත්, එබඳු ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් විවාහ. ක් අවලංගු කිරීමට දෙන ලද නියෝගයක වලංගු බව සම්බන්ධයෙන් පැන නගින කිසියම් ප්‍රශ්නයක් තීරණය කර ගැනීමේ කාර්‍ය්‍ය සඳහාත් උඩරට විවාහ ආඥාපනත තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(3) යථෝක්ත ආඥාපනත යටතේ ආරම්භව, නියමිත දිනයට ප්‍රථමයෙන් නිමවී නො තිබුණු කිසියම් ක්‍රියාවක් සම්පූර්ණ කර ගැනීමේ කාර්‍ය්‍ය සඳහා උඩරට විවාහ ආඥාපනත තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(4) නියමිත දිනයට ප්‍රථම සිදුවී ඇති එබඳු කිසියම් විවාහයක වලංගු භාවය සම්බන්ධයෙන් පැන නගින යම් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමේ කාර්‍ය්‍ය සඳහා උඩරට විවාහ ආඥාපනතේ සහ උඩරට විවාහ පිළිබඳ (සැක හැරීමේ) ආඥාපනතේ විධිවිධාන තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(5) එබඳු කිසියම් විවාහයක් නියමිත දිනයට ප්‍රථම අවලංගු කිරීමේ ස්ථිරතාව සම්බන්ධයෙන් පැන නගින කිසියම් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමේ කාර්‍ය්‍ය සඳහා උඩරට විවාහ ආඥාපනතේ විධිවිධාන තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(6) එබඳු කිසියම් විවාහයක් උඩරට විවාහ ආඥාපනත යටතේ ලියා පදිංචි කරන්නට ප්‍රථමයෙන් එම විවාහවූ පක්ෂ දෙකකට ලැබුණු කිසියම් දරුවකුගේ සුජාත බව, හා එබඳු දරුවකු කෙරෙහි ඇති බලතල පිළිබඳ වූ කිසියම් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමේ කාර්‍ය්‍යය සඳහා උඩරට විවාහ ආඥාපනතේ 27වෙනි වගන්තියේ විධිවිධාන තව දුරටත් බල පවත්වාගෙන යනු ලැබේ.

(7) එබඳු කිසියම් විවාහයක්, නියමිත දිනයට ප්‍රථමයෙන්, විවාහ ලියා පදිංචි කිරීමේ ආඥාපනත යටතේ හෝ එම ආඥාපනත මගින් අවලංගු කරනු ලැබූ සෙසු කිසියම් ආඥාපනතක් යටතේ හෝ සිදු කරනු ලැබීම හෝ ලියා පදිංචි කරනු ලැබීම, උඩරට නීතිය අනුව හා එය යටතේ දේපල ලැබීමට, එම විවාහය හා සම්බන්ධ වූ පුද්ගලයන් සතුව හෝ එම පුද්ගලයන්ගේ මාර්ගයෙන් හෝ එම පුද්ගලයන්ගෙන් උරුම කම් කියන පුද්ගලයන් සතුව පවත්නා බලතල කෙරෙහි, විරුඬව බල පවත් වනු නොලැබේ.

. මෙම ආඥාපනතේ සෙසු කිසියම් විධිවිධානයක කුමක් තිබුණද, මේ ආඥාපනතේ අංක 32 දරන වගන්තියේ විස්තරව ඇති ..ම හේතු උඩ හෝ කිසියම් හේතුවක් උඩ, උඩරට විවාහ ආඥා යටතේ ලියා පදිංචි කරන ලද විවාහයක් අවලංගු කළ හැකිය. මෙම ආඥාපනතේ IVවෙනි කාණ්ඩය උඩරට විවාහ ංයින් යම් ආකාරයකින් යම් ප්‍රමාණයකට අදාළ වන්නේ ද, පූර්ණවාක්ත කාර්‍ය්‍යය සඳහා පමණක් ම, කාණ්ඩය එම ආකාරයෙන් එම ප්‍රමාණයට අදාළ වන්නේ ය.

ඇතැම් විවාහ සඳහා iv කාණ්ඩය අදාළවීම.

71. යම් විවාහයක් හා සම්බන්ධ වන පක්ෂ දෙකෙන් එක් පක්ෂයක් වත් උඩරට නීතියට යටත් වන පුද්ගලයකු නො වූ කල්හි, බඳු විවාහයක් මෙම ආඥාපනත යටතේ සිදු කිරීමට හෝ ලියා දිංචි කිරීමට, උඩරට පරම්පරා ආඥාපනතේ අංක 4 දරන ඳින්තියේ අංක (2) දරන උප වගන්තියේ සඳහන් කිසිවකින් බලය නො ලැබෙන්නේ ය. එසේම බලය ලැබෙන හැටියට ද සලකනු නො ලබන්නේ ය.

මෙම ආඥාපනත යටතේ සිදුවන විවාහ සම්බන්ධයෙන් 98වෙනි පරිච්ඡේදය අදාළ නොවිය යුතු බව.

උපලේඛනය

**උඩරට පළාත්**

I කොටස

යටතේ සඳහන් පළාත් නම්—

(1) මධ්‍යම පළාත.

(2) උතුරු මැද පළාත.

(3) ඌව පළාත, සහ

(4) සබරගමු පළාත ද වේ.

## II කොටස

මේ යටතේ සඳහන් ප්‍රදේශ නම්—

(1) උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ චින්නචෙඩ්ඩිකුලම් කෝරළේ නැගෙණහිර හා බටහිර, සහ [illegible]ක්කමුලයි කෝරළේ දකුණ.

(2) නැගෙණහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුව, වැගම් පත්තුව සහ පනම පත්තුව, සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් පත්තුව.

(3) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ දෙමළ හත්පත්තුව ද වේ.